ශක්ති ප්‍රබෝධනය

පවුලේ සඟරාව

# ශක්ති ප්‍රබෝධනය

සියවසක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2021 මැයි | 122 වන කාණ්ඩය - 02 කලාපය | පිටු 32 | QD/81/පුවත්/2021

## වාක් ප්‍රසාද ගැබඹයනී



ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල සඟරාව

ආරම්භය 1899

# රෑ සඳ අහස් ගඟෙන්......

පද රචනය - පූජ්‍යපාද රඹුකන සිද්ධාර්ථ හිමි
තනු නිර්මාණය - ආචාර්ය රෝහණ වීරසිංහ
ගායනය - විශාරද නන්දා මාලනී



පුනගැයුම :

රෑ සඳ අහස් ගඟෙන් ගෙනා සිසිල මහ පොළොවට
හිමිදිරියේ පිණි කැට සේ
දිළිසෙන විට ලා තණ මත
සිහිවෙන්නේ මට අම්මාවයි
අම්මගේ හොරෙන් හැඬූ
කඳුළු කොයි තරම් //

කුලී වැඩ පලෙන් එතෙරව - වෙලී දරු දුකින් දිවයන
මැණික් මාලිගාවකි නුඹ සසර සාගරේ
සැලී තණ කිරෙන් සැනපුව - හුදී ජන පහන් කරඬුව
කඳුළු මාලිගාවකි නුඹ
සසර මාවතේ //

බඳා හදවතින් දරු දුක - නිවා දූ පුතුන් ලය දුක
නෙලාගෙන දැනුම් දී පොරි රැයේ හාමතේ
වලාවෙන් මිදී සඳ ලෙස - දයාවෙන් වෙලී ගෙට එන
කුලී මාලිගාවකි නුඹ
සසර ජීවිතේ //

පූජ්‍යපාද රඹුකන සිද්ධාර්ථ හිමියන් විසින් සිය වදනින් චිත්‍රණය කරන ලදුව, රෝහණ වීරසිංහයන්ගේ සහ නන්දා මාලනියන්ගේ අනුපමේය කෞශල්‍යයන්ගෙන් හැඩවූ මේ අපූරු ගේය සිත්තම, සැබවින්ම විශිෂ්ට කලා කෘතියකි. ඒ මන්දයත්, මව්වරුන් ගැන ලියැවී ඇති සියක් කවි ගී අතර, හදවතේ ගැඹුරුම තැන අමතන්නට සමත් නිර්මාණයකි, මෙම ගීතය.

ඝන අඳුරේ හිරුට හොරා මහ පොළොවට ඇද වැටෙනා පිනි බිඳු සේ, අම්මා කෙනකුගේ කඳුළු බිඳු ඇද හැළෙන්නේ සිය දරුවන්ටත් හොර රහසේය. එනමුදු ඒ බැව් දන්නා හඳුනන දූ පුත්තු සිටිත් නම් ඔවුහු සැබවින්ම භාග්‍යවන්තයෝය. වැඩ පොළක කඹුරනා දිළිඳු කුලී සේවිකාවක් වූ සිය මව, රචකයාට පෙනෙන්නේ රුවන් මාලිගාවක් මෙනි. ඇයගේ නෙතින් ගලනා කඳුළු කැට පවා ඒ මාලිගාවේ මිණි කැට හා සමානය. අම්මා යනු ඒ තරම් අසමසම උත්තමාවකි.

තමන් හාමතේ සිටියද, අම්මා සිය දරුවන්ගේ කුස පුරවන්නේ දාරක ස්නේහය නිසාමය. ඇය නිවා දමන්නේ ඔවුන්ගේ කුසේ ගිනි පමණක් නොවේ; ඔවුන්ගේ ළයේ ගිනි පවා ඇය තමා සන්තක කර ගන්නීය. සිය දරුවන්ට කිසි දුකක් නොදීමට ඇය වගබලා ගන්නීය. එහෙයින් රචකයා පුනරුච්චාරණය කරයි - අම්මා 'කුලී සේවිකාවක්' නොව 'රුවන් මාලිගාවක්' ම වේ.

වත්මනේ දරුවන්ගෙන් කීයෙන් කී දෙනෙක් තම මව්වරුන් ඔවුන් වෙනුවෙන් කරනා කැපකිරීම් සමුදාය අගය කරන්නෝද? අගය කිරීම කෙසේ වෙතත්, ඒ බැව් වටහා ගැනීමට තරම්වත් ඔවුහු සංවේදී හදවත් ඇත්තෝද? ඒ සමාජ පාපයට අවදි වන්නට සිද්ධාර්ථ හිමියන් මෙම ගේය සිත්තම හරහා අපට ආරාධනා කරනවා නොවේද?

ගරු ශානිල් දිනුක ජයවර්ධන (නි.ම.නි.) පියතුමා
රෝමයේ සිට

# ශක්ති ප්‍රබෝධනය

2021 මැයි


ප්‍රකාශනය

**නිර්මල මරිය නිකාය**

භාරකරු

**අතිගරු රොෂාන් සිල්වා නි.ම.නි. පියතුමා**
**නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති**
**කොළඹ ප්‍රාදේශිකය**

සංස්කාරක

**ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා**

සංස්කරණ සහාය

**රූපස් ප්‍රැන්සිස්**
**ටී. සුනිල් ප්‍රනාන්දු**
**ෆිලීෂන් අබයකෝන්**

මුද්‍රණ සැලසුම හා කවර නිර්මාණය

**අචල රූපසිංහ**

මුද්‍රණය

**කතෝලික මුද්‍රණාලය**
**කොළඹ 08.**


## පිටුවෙන් පිටුව..........


2 කවරයේ කථාව

3 හෙළිදරව්ව

4 අව්‍යාජ මරිය බැතිය
- ගරු සිසිල් ජෝයි පෙරේරා පියතුමා

8 ආස්වාදය - සපුගස්කන්දේ රංජිත්

9 ලොතරැයියක් වූ තලෙන්තු
- රොඩ්නි වර්ණකුල

10 ඕං ඔහොමයි
- බෙනඩික් විජේසිංහ
චුට්ටා
- ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි. පියතුමා

12 වාක් ප්‍රසාද ගැබයෙනි
- වෙන්නප්පුවේ පයස් ප්‍රනාන්දු

13 කවි පඬුරක්
- ශාන්ත කටුකුරුන්ද

14 නමෝ මරියනී
- වෛද්‍ය සචිත මිලින්ද මෙන්ඩිස්

16 මරිය තුමියට තවත් දරුවෝ සිටිත් ද?
- ගරු ඇල්වින් පීටර් ප්‍රනාන්දු පියතුමා

19 අමිතගේ හද ගැස්ම - සී. අමිත

20 ඕං එහෙනං - ජෝසප් ඩයස්

21 මගේ ආදර දේව අම්මේ - එම්. පද්මලතා ඕබ්‍රිස්

22 පුංචි විකුම් - සූරිය මාමා

23 චතාරික වන්දනාව - මාක් ජයමාන්න

24 ධර්මදානයේ මාතාවන් වන මරියෝත්තමාවෝ
- බුද්ධික සඳරුවන්

25 සිරි ලක් විලේ
- ශෙවෝන් පෙරේරා

26 ප්‍රහේලිකා අංක - 63
- ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා


27 මරි මව්නි
- වින්දන සාවින්ද

28 කතෝලික ධර්මය අ.පො.ස. (සා./පෙළ) 2021 ආදර්ශ ප්‍රශ්න පත්‍රය - II කොටස
- ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය.

30 අ.පො.ස. (උ./පෙළ) ක්‍රිස්තියානි ධර්මය විශ්ව සභා ඉතිහාසය III - එස්. හේමාල් පෙරේරා

වසර 1899 සිට අඛණ්ඩව
එළිදක්වන භක්ති ප්‍රබෝධනය
ශ්‍රී ලංකාවේ පළවන
ඉපැරණිම සිංහල සඟරාවයි.
භක්ති ප්‍රබෝධනය
නිර්මල මරිය නිකායේ
කොළඹ ප්‍රාදේශිකයේ
භාරකාරත්වය යටතේ
පළවන ප්‍රකාශනයකි.
(නි.ම.නි.)

Bhakthi Prabodhanaya,
Published continuously
since 1899, is the oldest
Sinhala magazine
in Sri Lanka.
Bhakthi Prabodhanaya,
is owned and published by
the Colombo Province of the
Oblates of Mary Immaculate.
(O.M.I.)


## කවරයේ කථාව

පුරාණ ගිවිසුම තුළ, දස පණත අඩංගුව තිබූ ගිවිසුම් කරඬුව, ඉශ්රායෙල් ජනතාවගේ දේව වන්දනාවේ කේන්ද්‍රීය ශුද්ධ වූ වස්තුව විය. එකල, එය අති විශේෂ ලෙස මනුෂ්‍යයන්ව පාපයෙන් ගැලවීමට දායක විය. එහෙත් මෙම ගැලවීම පූර්ණත්වයට පත්වන්නේ දේව මෑණියන් හරහාය. නව ගිවිසුමේ "දේව වචනය" දරන්නිය මරියෝත්තමාවෝය. එතුමිය උපත දෙන්නේ ලෝ ගැලවුම්කරුවාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේට ය. ගිවිසුම් කරඬුව සහ මරියෝත්තමාවන් ඉදිරිපත් කරමින් කවරයේ කථාව පවසන්නේ, දෙවියන් වහන්සේගේ ගැලවීමේ කාර්යභාර්ය පුරාණ ගිවිසුමෙන් ආරම්භ වුවත්, එය පරිපූර්ණත්වයට පත්වන්නේ අලුත් ගිවිසුමින් බවය.

ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා


**භක්ති ප්‍රබෝධනය**

දායකත්වය එක් වසරකට - රු. 500.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

දායකත්වය සය මසකට - රු. 250.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලුම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපැල :
bhakthi.prabodhanaya@gmail.com

**BHAKTHI PRABODHANAYA**

Local Subscription Rate.
Rs. 500.00 per year (Including Postage)
Rs. 250.00 per six months
(Including Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com






# වාක් ප්‍රසාද ගැබයෙනි

හෙළිදරව්ව

## (Ark of the Covenant)

දේව මාතා ප්‍රාර්ථනාවේ සඳහන් මෙම යෙදුම මරියෝත්තමාවන්ට දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය ලැබුණු අයුරු ප්‍රකාශ කරන්නට රචකයා ගත් අපූරු වෑයමකි. වචනාර්ථය දෙස බැලීමේදී වාක් යනු වචන ය. ප්‍රසාද යනු දීමනාය. ගැබය යනු බහාලුමක් හෙවත් යමක් රැඳවිය හැකි ඉඩ ප්‍රමාණයකි. ප්‍රාර්ථනාව ලියන්නා මරිය තුමියට "වචනයේ දීමනාවේ රඳන්නිය" ලෙස ආමන්ත්‍රණය කළේ ඇයිද යන්න වටහා ගන්නට පුරාණ ගිවිසුමේ ගිවිසුම් කරඬුව අවබෝධ කරගැනීම වැදගත් ය. මෙහි තිබෙන්නාවූ බයිබලීය පසුබිමද එවිට තේරුම්ගත හැකිය.

සීනයි කන්දේ දී සමිඳාණන් වහන්සේ සිය ආඥා හා අණපනත් අඩංගු ගල් පුවරු මෝසෙස්ට දුන් සේක (නික්ම. 24:12). එම ගල් පුවරු තැන්පත් කරන්නට ගිවිසුම් කරඬුව සෑදිය යුතු ආකාරය, භාවිත කළ යුතු අමුද්‍රව්‍ය, දිග, පළල, උස ආදි කරුණු ගණනාවක් නික්මයාම පොතෙන් අපට හමුවේ (නික්ම. 25: 10-22).

පුරාණ ගිවිසුමේ ජනතාව ගිවිසුම් කරඬුව තුළ තැන්පත් කළ දස පනත "දේව වචනය" ලෙස පිළිගත්හ. ජීවිතය ජීවත් කළ යුතු ප්‍රතිපදාව එයින් මතුවිය. දෙවියන් වහන්සේට සහ අන් ජීවිතවලට ගෞරවාන්විතව සහ සදාචාරාත්මකව ජීවිතය ගත කළ යුතු මූලධර්මය එහි අන්තර්ගතය විය. එසේ නම් පුරාණ ගිවිසුමේ දේව වචනය දරා ගත්තේ ගිවිසුම් කරඬුව තුළය. අලුත් ගිවිසුමේදී මිනිස් බව ගත් දේව වචනය හෙවත් ජේසුස් වහන්සේව දරාගත්තේ මරිමව් කුස තුළය. ඒ සඳහා මරියෝත්තමාවන් අති විශේෂ ආකාරයෙන් දෙවියන් වහන්සේ තෝරාගත් සේක. ගාබ්‍රියෙල් දේව දූතයා මරිය තුමියට ක්‍රිස්තු උපත පිළිබඳ පුවත සැල කළ පසු මරිය තුමිය එම කැඳවීමට අවනත වූවාය. එතුමිය පවසන්නේ, "මම සමිඳාණන් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙසම මට ඉටුවේවා" (ලූක් 1:38). තුන්කාල ආරාධනාව යදින විට අප පවසන්නේ, "වචනය තෙමද මාංසගත වුණේය. අප සමඟ ද වාසය කළේය" යන්නයි.

සැබවින්ම ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ උපදින දරුවා දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන බව දේව දූතයා පැවසීය. ඒ අනුව ශුද්ධාත්මානුභාවයෙන් පුරුෂ ස්පර්ශයකින් තොරව වචනය පිළිසිඳ ගත්තේය. ඒ නිසාම මරිය තුමිය අලුත් ගිවිසුමේ ශ්‍රී වචනය දරන්නිය බවට පත්වේ. දේව මාතා ප්‍රාර්ථනාවේදී වාක් ප්‍රසාද ගැබයෙනි යනුවෙන් දේව මාතාවන් වහන්සේව ආමන්ත්‍රණය කරන විට එම වදන් ශුද්ධ වූ බයිබලයට එකඟ වන්නක් මිස හුදෙක් රචකයාගේ හුදකලා වූ පෞද්ගලික සිතුවිල්ලක් හෝ අතිශයෝක්තියක් හෝ නොවන බව සක්සුදක් සේ පැහැදිලිය.

කතෝලික සභා මාතාව මෙතරම් මරියෝත්තමාවන්ට භක්ති ආදරය පුදන්නේ දෙවියන් වහන්සේම එතුමිය දේවත්වය සහ මනුෂ්‍යත්වය එකට යා කරන පාලමක් වන්නට කැඳවූ නිසාය. එතුමිය ඉතා ජ්වලිතව, එම ආරාධනාවට පිළිතුරු දෙමින් තම පුතණුවන්ගේ ලෝක ගැලවීමේ මහා කාර්යභාරයට සක්‍රියව දායක වූවාය. එතුමිය කතෝලික සභාව තුළ මාතෘ පදවියේ පරමාදර්ශයයි. මරියෝත්තමාවන් මෙලොව අඳුර සහ අරගල සමග පොරබදින කිතුනුවාගේ ජීවිතයට මහ අස්වැසිල්ලක් වනුයේ, එතුමියද එවන් වික්ෂෝපවලට මුහුණ දෙමින් අභියෝග සහ දුක් කම්කටොලු හමුවේ නොසැලී අචල ශ්‍රද්ධාවෙන් තමන් ලැබූ කැඳවීමේ තිළිණය පූර්ණත්වයට පත්කරමින් අරගල පරදන දිරිය මවක වී අවසානය දක්වාම ක්‍රිස්තු ශ්‍රාවක ගමනක යෙදුණ නිසාය.

භාග්‍යවන්ත අම්මා හෙවත් මරිය මාතාවගෙන් අප උකහා ගත යුත්තේ එතුමියගේ ජීවිත පූර්ව ආදර්ශය අප ජීවිත තුළ ජීවමාන කරවීම නොවන්නේද? අන් කවර ආකාරයකින් එතුමියට ගෞරව කරන්න උත්සහ කළද, ඒ සියලු බාහිර ක්‍රියාකාරකම් ක්‍රිස්තු ශ්‍රාවක ජීවිතයට දූරස්ථ අසම්පූර්ණ වන බව අප අවබෝධකර ගැනීම අප්‍රමාදව කළ යුතු නොවේද? වාක් ප්‍රසාද ගැබයෙනි අප නිසා යාච්ඤා කළ මැනවි.




කතෝලික අපි කවුරුත් මරියෝත්තමාවන්ට බෙහෙවින් ප්‍රේම කරමු. අපි ඒ ගැන ආඩම්බරයෙන් සාක්ෂි දරන්නට ඉදිරිපත් වෙමු. මූලධර්මවාදී කිතුනුවන් හෝ ප්‍රතිසංස්කරණවාදී කිතුනුවන් හෝ අන්‍ය ලබ්ධිකයන් හෝ මරියෝත්තමාවන් අවතක්සේරු කරන විට අපි බොහෝ විට මරියෝත්තමාවන් වෙනුවෙන් සටනට අවතීර්ණ වෙමු.

එමෙන් ම මරිය බැතිය කෙරෙහි අපි බොහෝ සේ උත්සුක වන්නෙමු. දිනපතා ම කෙසේ වෙතත් නිතර අපි ජපමාලය උච්චාරණය කරමු. මැයි මාසයේ බැතිය සහ දේව මාතාවන්ගේ මංගල්‍ය සියල්ලම මෙන් ඉතා භක්තියෙන් සහ ආදරයෙන් සමරන්නෙමු. ලූර්දුවට හෝ පාතිමාවට හෝ මෙජුගෝරියට හෝ යන්නට කාසි හිඟ වුවත් මඩු පල්ලියට හෝ තේවත්තට හෝ මාතර පල්ලියට හෝ නොවරදවා ම යන්නෙමු. තේරුම හරි හැටි දන්නේ නැති වුවත් අපි කාර්මෙල් බෙන්තිඤ්ඤය පළඳිමු. මරියෝත්තමාවන් වෙනුවෙන් ඕනෑ ම කැප කිරීමක් කරන්නට අපි සැබවින් ම ලැදි වෙමු. ප්‍රශංසා කටයුතු මේ සියල්ල සිදු කළ ද ඇතැම් අය පවසන්නේ අපේ ජීවිත, ආදි වූවා සේම දැනුත්, මතුවටත් බොහෝ විට දුර්වල කමේ ම සහ පාපයේ ද පවතින බවයි. මරියෝත්තමාවන්ගේ ජීවිතාදර්ශය ඇත්තෙන්ම අපේ ජීවිතවල වෙනසක් කරන්නට පොහොසත් වූ බවක් පෙනෙන්නට නැති බව ඔවුන්ගේ අදහස යි. සියල්ලන් සම්බන්ධයෙන් මෙය සත්‍ය නොවන බව නම් අවධාරණය කළ යුතු වුව ද මෙහි කිසියම් සත්‍යයක් ඇත්ද යි විමසා බැලීම ද මේ සඳහා මරිය බැතියේ ව්‍යාජ හෝ අව්‍යාජබවේ හෝ බලපෑම විමසා බැලීම ද කාලෝචිත බව සිතමි.

ඇත්තෙන් ම අව්‍යාජ මරිය බැතිය යනු කුමක් ද? මරිය බැතිය ගැන සහ මරිය පිළිවෙත් පිළිබඳව ලියැවුණු සාරගර්භ පොතපත බොහෝ ය. මරියෝත්තමාවන් සමග ඉතා සමීප ආත්මික බැඳීමෙන් ජීවත් වූ ශුද්ධවන්තයන් සහ ශුද්ධවන්තියන් ද බොහෝ ය. එහෙත් ඒ අතරින් එක් සුවිශේෂි ශුද්ධවන්තයකු හා එතුමන්ගේ මරිය බැතිය ඇසුරෙන් යථෝක්ත ප්‍රශ්නයට පිළිතුරක් යෝජනා කරන්නට මෙම ලිපිය උපයෝගී කරගනිමි. ඒ ශුද්ධවන්තයා 1673 සිට 1716 තෙක් ප්‍රංශයේ විසූ ලුවී මරී මොන්ට්ෆෝර්ට් ය.

දෙවන ජුවාම් පාවුලු පාප් වහන්සේ තමන් වහන්සේගේ ආදර්ශ පාඨය ලෙස ගත්තේ තෝතුස් තූඋස් යන්න යි. එහි සම්පූර්ණ වැකිය වන්නේ "තෝතුස් තූඋස් ඒගෝ සුම්" යන්න යි. එහි අර්ථය මම සම්පූර්ණයෙන් ම ඔබවහන්සේගේ වෙමි යනුවෙන් පරිවර්තනය කළ හැකිය. පාප් වහන්සේ මෙය උපුටා ගත්තේ සාන්ත ලුවී මරී මුනිතුමන් ලියූ අප ස්වාමිදූට ජීවිත පවරා දීමේ යැදුමේ මුල් වදන්වලිනි. ඇත්තෙන් ම දෙවන ජුවාම් පාවුලු පාප් වහන්සේ සාන්ත ලුවී මරී මුනිතුමන්ගේ මරිය බැති ධර්මෝපදේශය පිළිබඳව බෙහෙවින් පැහැදී සිටීම මෙයට හේතුවයි. එබැවින් මෙම ලිපියේ ද සාන්ත ලුවී මරී මුනිතුමන් ඉදිරිපත් කළ අව්‍යාජ මරිය බැතිය ලේඛනය බොහෝ දුරට මූලාශ්‍රය වී ඇති බව සඳහන් කරමි. එතුමන්ගේ එම ලේඛනය පිළිබඳ ඉතා රසවත් පුවතක් ද මෙහිලා සටහන් කරනු කැමැත්තෙමි.

එවකට ඉතා බලගතු ලෙස පැතිර යමින් තිබුණු ජැන්සනිකවාදයට එරෙහිව දේශනා කරන්නට සහ උගන්වන්නට සාන්ත ලුවී මරී මුනිතුමන් දැරූ ප්‍රයත්නය නිසා ම, එතුමන්ට වරක ප්‍රංශයේ ල රොෂෙල් නම් ස්ථානයේ දී එතුමන්ගේ එදිරිවාදීහු වස පොවන්නට යෙදුණාහ. එහෙත් එම මාරාන්තික ප්‍රහාරයෙන් තම දිවි ගලවා ගැනීමෙන් පසුව අව්‍යාජ මරිය බැතිය නම් කෘතිය එතුමා රචනා කළේ ය. මේ කෘතිය පාඨකයන් අතර සංසරණය වන්නට පටන් ගත්තේ එතුමන් ස්වර්ගස්ථ වී වසර





200 පමණ පසුවය. ඒ කෘතියේ අඩංගු බොහෝ දේ අදටත් අපට අව්‍යාජ මරිය බැතිය පිළිබඳව ඉතා වැදගත් ධර්මෝපදේශයක් වෙයි. පහත ලියා තිබෙන බොහෝ දේ පදනම්ව ඇත්තේ ඒ කෘතියේ සඳහන් කරුණු මත යි.

### 01 මරිය බැතිය අවශ්‍ය වන්නේ ඇයි?

1. මරියෝත්තමාවන් මාංසගතවීමේ අභිරහසේ කොටස්කාරියක වීම නිසා පුරාණ ගිවිසුමේ දේව ජනතාව සහශ්‍රක හතරක් පුරා බලා සිටි මෙසියස් වහන්සේ අපට දනය කරන්නට දෙවියන් වහන්සේ තෝරා ගත්තේ මරියාවන් ය. ජේසුස් වහන්සේගේ ජීවිතයේ මුල සිට අග දක්වා ම සහ සාන්ත සභා ජීවිතයේ ආරම්භයේ ද එතුමිය ඉටු කළ කාර්යභාරය විමුක්ති ඉතිවතේ බෙහෙවින් වැදගත් වෙයි.

2. එතුමියගේ බලගතු මාතෘක යැදුම් මැදහත්කම නිසා එලිසබෙත් තුමිය බැහැදකින්නට ගිය අවස්ථාවේ දී පැවසූ වදනින් ස්නාවක ජුවාම් මුනිඳුන් එලිසබෙත් තුමියගේ කුස තුළම දේව ක්‍රියාකාරිත්වයට ප්‍රතිචාර දැක්වීය. කානා නුවර මංගල සාදයේ දී ජේසු සමිඳාණන් වහන්සේ ම තම මෑණියන්ගේ ඉල්ලීම ඉවත නොදමා ප්‍රතිචාර දැක්වූ සේක. ඒ බලගතු යැදුම් මැදහත්කම අද, වෙන කවරදකවත් නොවූ ආකාරයකට අවශ්‍යව ඇති බව පෙනේ.

### 02 මරිය බැතියේ ධර්ම ප්‍රතිපත්ති මොනවා ද?

1. ඕනෑම මරිය බැතියක අවසාන අරමුණ විය යුත්තේ ක්‍රිස්තුන් වහන්සේ ය. පාවුලු තුමා කොලොස්ස හසුනේ පළමු පරිච්ඡේදයේ පවසන්නේ, සියලු දෙනාම පරිණත කිතුනුවන් වන පිණිස සියලු දෙනාට ම දැනමුතුකම් දෙමින් සියලු ආකාර ප්‍රඥාවෙන් අනුශාසනා කරමු. මේ සඳහා මා තුළ බලවත් සේ ක්‍රියා කරන ක්‍රිස්තුන් වහන්සේගේ බල මහිමයේ ප්‍රකාරයට දිරි දරමින් වීර්ය කරමි යනුවෙනි. මරිය බැතියේ අවසාන නැවතුම මරියෝත්තමාවන් නොවේ. ඇය අපට කරන්නට කියන ඕනෑම දෙයක් කරන අප (ජුවාම් 2:5) අවසානයේ නවතින්නේ, ජල බඳුන් පුරවන්නට අපට අණ කරන සහ සාමාන්‍ය ජලය මිදි රස බවට පත්කරන්නට අප දයක කරගන්නා විමුක්තිදයකයාණන් සමග ය. ඒ වන විට දේව අම්මා කියා නිම කළ නොහැකි සතුටකින් පසකට වී, නිහතමානිව, අපගේ ජීවිත පරිවර්තනයේ ප්‍රාතිහාර්යය දකිමින් දෙවියන් වහන්සේ පසසන්නී ය. ජපමාල උච්චාරණයේ දී හෝ තුන් කාල ආරාධනාවේ දී හෝ ප්‍රධාන අරමුණ මරියෝත්තමාවන් සමග ක්‍රිස්තු අභිරහස් මෙනෙහි කිරීම මිස මරියෝත්තමාවන් දේවත්වයට පත් කිරීම නොවේ.

2. අව්‍යාජ මරිය බැතිය අප තුළ ඇති පාපතර සියල්ල අත්හරින්නට අප යොමු කරයි. "මේ මම සමිඳාණන් වහන්සේගේ දාසිය වෙමි" යයි කී මොහොතේ සිට මරියෝත්තමාවෝ එතෙක් තමන් තුළ රඳවා සිටි පිරිසුදුබව තව තවත් පූර්ණත්වයට පත් කරන්නට වෙහෙසුණාහ. දෙවියන් වහන්සේගේ අභිමතය සොයා එය උපරිමයෙන් ඉටු කරනු වස් එතුමිය තමන්ගේ ආත්මාර්ථයට සහ ස්වාර්ථයට පණ නොදී දිනපතා ම දේවාර්ථය සහ පරාර්ථය පමණක් සොයමින් තමන් තුළ ඉතිරිව තිබිය හැකි කිසියම් පාපතරබවක් වේ නම් ඒ සියල්ල මුලිනුපුටා දැම්මා ය. අව්‍යාජ මරිය බැතිය අප යොමු කළ යුත්තේ එවැනි ජීවිත ප්‍රතිපදවකට ය. ජුවාම් සුබාරංචියේ 12:24 හි පවසන අන්දමට තිරිඟු බීජය මෙන් පොළොවේ වැටී මිය යාමෙන් පල දරන තත්ත්වයකට පත්වීමට ය. නොඑසේ නම් අපගේ මරිය බැතිය පල නොදරන පැලෑටියක් පමණි. සෙමින් හෝ අධිෂ්ඨානපූර්වකව, පාපතර බවින් මිදී, ජීවිතයේ ශුද්ධත්වය කරා අප යොමු කිරීම අව්‍යාජ මරිය බැතියේ අනිවාර්ය ලකුණකි.

3. මේ මම සමිඳාණන් වහන්සේගේ දාසිය වෙමි නම් ධර්ම ප්‍රතිපත්තිය පුරාතනයේ මෙන් අපි අද වහලුන් ගැන කතා නොකරමු. මානව අභිමානය සහ කම්කරු අයිතිවාසිකම් ගැන දැඩි අවධානයක් සහිත වර්තමානයේ අපි මෙම වචනය පවා භාවිතයෙන් ඇත් කොට පිළිකුල් කරමු. සේවකයා සහ සේවා දයකයා වැනි වචන නිතර ම ඇසෙන, වඩා ගෞරවාන්විත යෙදුම් බවට පත් වී ඇත. එහෙත් ආත්මික ජීවිත තත්ත්වයන් විශ්ලේෂණයේ දී මෙය වෙනස් බව අවබෝධ කර ගත යුතු වෙයි. පිලිප්පි 2: 6-11 වගන්තිවල ජේසු සමිඳාණන්ගේ මාංසගතවීම පිළිබඳ විස්තරයේ දී සඳහන් වනුයේ උන්වහන්සේ තමන් වහන්සේ

සතු සියලු බල මහිමයන් ත්‍යාජ කර වහලකුගේ මෙන් වන දස ස්වරූපයක් ගත් බවයි. වෙනස වන්නේ මේ දස ස්වරූපය තමන් ඉටු කරන සේවය වෙනුවෙන් කිසිවක් අපේක්ෂා නොකරන අතර, උපරිමයෙන් පල දරන්නට කැප වීමයි. එමෙන් ම තමන්ව පාපයෙන් සහ නිරයෙන් මුදා ගැනීම සඳහා, තම ස්වාමියාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සිය රුධිරය හෙළා අප වෙනුවෙන් මිලක් ගෙවූ බව මෙම දසයාට සිහිපත් වන බැවින්, හෙතෙම තම ජීවිතය මුළුමනින් ම කැප කරන්නේ ගෞරවාන්විත ස්වේච්ඡා සේවක බවකටය. මෙය සාමාන්‍ය සමාජ තත්ත්වයන් සමග සංසන්දනය කළ නොහැකිය. ඇත්තෙන් ම වහල්භාවයන් අවම වශයෙන් දෙකකි,

- ස්ව කැමැත්තෙන්ම වහල්බවින් සේවය කිරීම.
- බලෙන් වහල් බවට පත් කිරීම.

බොහෝවිට සැබෑ ආදරය ඇති තැන අපි කිසිදු අයිතිවාසිකමක් හෝ වේතනයක් හෝ අපේක්ෂා නොකර උපරිමයෙන් වැඩ කරමු. මවක තම දරුවන් වෙනුවෙන් බොහෝවිට කරන්නේ සේවයක් නොව, ප්‍රේමයේ ගෞරවාන්විත වහල්කමකි. මරියෝත්තමාවෝ දෙවියන් වහන්සේට ඇති ප්‍රේමය නිසා ඒ ගෞරවාන්විත එහෙත් පරම දස බව ආදරයෙන් වැළඳ ගෙන, ඒ වෙනුවෙන් ම ජීවත් වූහ. අපට අවැසි වන්නේ එවැනි ආකල්පයකි. එබැවින්, මරිය බැතියට වඩා අප ජීවිත වෙළා ගත යුත්තේ මරිය ගතියයි.

4. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ වෙත යාම සඳහා මධ්‍යස්ථකාර මෑණියන්ගේ සරණය දෙවියන් වහන්සේ, ජේසුස් වහන්සේව අප වෙත දනය කළේ මරියෝත්තමාවන් මගිනි. එබැවින් ජේසුස් වහන්සේ වෙත යාමට අප සතු සුදුසු ම මාර්ගය වන්නේ ද මරියෝත්තමාවන්ය. සාන්ත බර්නාඩ් සහ සාන්ත බොනවෙන්චර් මුනිවරුන් පවසන්නේ දෙවියන් වහන්සේ වෙත යාම සඳහා අපට ක්‍රම කිහිපයක් තිබෙන බවයි. ඉන් පළමුවැන්න ලෙස ඔවුන් පෙන්වා දෙන්නේ, අපට සමීප කෙනකු මගින් දෙවියන් වහන්සේ වෙත යාමයි. දෙවැන්න, ක්‍රිස්තු සමිඳාණන් වහන්සේ මගින් යාමය. තෙවැන්න, සෘජුව පියාණන් වහන්සේ වෙත යාමයි. ඔවුන් පවසන්නේ, අපට සමීප මරියෝත්තමාවන් මගින් දෙවියන් වෙත ගමන් කිරීම ආත්මිකව ඉතා ඵලදායී වන බවයි. අපේ පව්කාර ජීවිත තත්ත්වය නිසා සෘජුව ම දෙවියන් වහන්සේ වෙත යන්නට අපි පැකිලෙමු. ස්වර්ගීය මෑණියන් වන මරියෝත්තමාවන් මගින් සමිඳාණන් වහන්සේ වෙත යාම ඒ නිසා වඩා සහනදායි වන බව පැහැදිලිය.

5. දෙවියන් වහන්සේගෙන් අප ලද වරප්‍රසාද ජීවිත තත්ත්වය කළමනාකරණය කර ගැනීම අසීරුය. 2 කොරින්ති 4:7 පවසන්නේ, අපි මේ වස්තුව රැ ස්කර තැබූ මැටි බඳුන් හා සමානය යනුවෙනි. අපගේ මානව දුර්වලකම් පිළිබඳව බැහැපත් ආකල්පයකින් යුතුව, අපරිමිත වටිනාකමකින් යුතු ඒ වරප්‍රසාද නිධානය ආරක්ෂා කරගැනීම පිණිස, නපුරාගේ හිස සිඳලූ මරියෝත්තමාවන්ගේ මාතෘක රැකවරණයට බාරවීමට ඇති හැකියාව, කතෝලික අපගේ වාසනාවකි. නපුරාට අප අසුවීමට ඉඩ නොදී ආරක්ෂා කරන අම්මා එතුමියයි. එතුමිය සතු අය කෙරෙහි නපුරාගේ බලය ශුන්‍ය බව දන්නා නිසා, එතුමියට කැපවීම කතෝලිකයන්ගේ සම්ප්‍රදයක් වූයේ ද එබැවිනි.

## 03 ව්‍යාජ මරිය බැති ආකල්ප

1. පැමිණිලිකාර ආකල්පය.
2. අතිශයෝක්ති සෝදිසි ආකල්පය.
3. ගැඹුරකින් තොර ආකල්පය.
4. ව්‍යාජ අරක්ෂාවක් අපේක්ෂා කරන ආකල්පය.
5. අස්ථාවර ආකල්පය.
6. රැවටිලිකාර ආකල්පය.
7. ආත්මාර්ථකාමී ආකල්පය.

### 1. පැමිණිලිකාර ආකල්පය

මෙයින් අදහස් කෙරෙන්නේ සැදැහැවතා මරිය බැතියට යොමු වුව ද නිතරම එම බැතියේ අඩුපාඩු සොයමින් පැමිණිලි සහ මැසිවිලි කියන්නකු වීම යි. තමන්ගේ පාණ්ඩිත්‍යය ප්‍රදර්ශනය කරමින්, නිතරම තර්ක කරමින් ඉන්නා ආකල්පය මෙම තත්ත්වය යි.

### 2. අතිශයෝක්ති සෝදිසි ආකල්පය

මේ ආකල්පය ඇති අය වුවමනාවට වඩා





පරිස්සම් වන අය වෙති. යමක් කරන්නට පෙර ඒ පිළිබඳව අතිශයෝක්තියෙන් සොයා බලා හැකි උපරිමයෙන් පරිස්සම් වන්නට දරණ වෑයම නිසා බොහෝවිට ඔවුහු අවසානයේ දී මරියේ බැතියේ යෙදෙනවාට වඩා නොයෙදී සිටිති.

### 3. ගැඹුරකින් තොර ආකල්පය

මේ ආකල්පය ඇති අය බාහිර වශයෙන් බැති පිළිවෙත්වල නියැලුණ ද ඒවායේ හරයක් හෝ ගැඹුරක් සොයන්නට උත්සුක නොවෙති.

### 4. ව්‍යාජ ආරක්ෂාවක් අපේක්ෂා කරන ආකල්පය

මෙය ද සාවද්‍ය ආකල්පයකි. මෙවැනි අය තමන්ගේ බැති කටයුතුවල නියැලීමෙන්, ආරක්ෂාව අපේක්ෂා කිරීම ප්‍රධාන අරමුණක් කර ගනිති. ඔවුන් ජපමාලය උච්චාරණය කරන්නේ හෝ වෙනත් මරිය බැති පිළිවෙත්වල යෙදෙන්නේ හෝ තමන්ගේ ආරක්ෂාව පිණිසය.

### 5. අස්ථාවර ආකල්පය

අස්ථාවර ආකල්පය දරන්නෝ වරක භක්තිමත්ව සිටින අතර, වරක සියල්ල අත්හැර දමති. ඔවුහු යළිත් කලකින් බැති පිළිවෙත් අරඹති. ඔවුන් තුළ මේ පිළිබඳව කිසිදු ස්ථාවර බවක් නැත.

### 6. රැවටිලිකාර ආකල්පය

මෙය පරිසි ආකල්පය යැයි කිව හැකිය. ඇත්තෙන්ම මෙය බොරුවකි. මෙය, ලෝකයාට පෙනෙන්නට සහ නමක් ලබා ගන්නට කරන නිරර්ථක අභ්‍යාසයකි.

### 7. ආත්මාර්ථකාමී ආකල්පය

තමන්ට කිසියම් කරදරයක් අසනීපයක් දුකක් වූ විට පමණක් ඉන් මිදීම සඳහා භක්ති අභ්‍යාසවල යෙදී, ඒ ප්‍රශ්නය නිම වූ විට භක්ති කටයුතු අත්හරින ආකල්පය මෙයයි.

## 04 අව්‍යාජ මරිය බැති ආකල්ප

1. ඇතුළාන්ත බැඳීම
2. විශ්වාසවන්ත බව
3. ශුද්ධවන්ත බව
4. ස්ථාවර බව
5. පරාර්ථකාමී බව

### 1. ඇතුළාන්ත බැඳීම

සැබෑ මරිය බැතිය ඇතුළාන්තය හා තදින්ම බැඳේ. එය හුදෙක් බාහිර ක්‍රියාකාරකම් සහ අභ්‍යාසවලින් පමණක් සෑහීමකට පත්වන්නේ නැත. මරියෝත්තමාවන්ගේ උදාන ගීයේ ආරම්භයේ මෙන්, එය ඇරඹෙන්නේ ආත්මයෙන් ම දෙවියන් වහන්සේ පසසමිනි.

### 2. විශ්වාසවන්ත බව

මෙය මවක සහ දරුවන් අතර ඇති ගැඹුරු ආදර විශ්වාසයේ බැඳීමයි. සැපේ දී මෙන් ම දුකේ දී ද දරුවන් තම අම්මා වෙත බැඳෙන්නේ එතුමිය කෙරෙහි ඇති අචල විශ්වාසය නිසාය. එය අවස්ථාවාදී හෝ කාලයට හෝ අවකාශයට හෝ සීමා වන බැඳීමක් නොවේ.

### 3. ශුද්ධවන්ත බව

සැබෑ මරිය බැතිය අප ජීවිත ශුද්ධත්වය කරා ගෙන යයි. එසේ නොවන්නේ නම්, එය සාවද්‍ය සහ නිරර්ථක අභ්‍යාසයකි. මරියෝත්තමාවන්ගේ මාතෘක යැදුම් සරණයෙන් සහ මහා ජීවිතාදර්ශය නිසා අපට අපගේ පව්කාර ජීවිතයෙන් ඇත්නොවී ඉන්නට හැකියාවක් නැත.

### 4. ස්ථාවර බව

කලක උතුරා යන භක්තියෙන් සියලු දේ ඉටු කරන අතර, පසුව ඇල්මැරුණු හෝ අතුරුදහන්වන ආකාරයේ භක්තියක් ඇතිවීම අස්ථාවර බවයි. මෙහි විරුද්ධ පැවැත්ම ස්ථාවර බවයි. එනම්, දිනෙන් දින වර්ධනය වන සහ ධාර්මිකව ගැඹුරු වන භක්තියක් ඇතිකර ගැනීමයි.

### 5. පරාර්ථකාමී බව

මරිය බැතිය අපව යොමු කළ යුත්තේ විශේෂයෙන්ම අන් අය වෙත සරණ වන්නන්වීමට ය. මෙය අප ඉගෙන ගන්නේ

11 වන පිටුවට.....

ගරු සිසිල් ජෝයි පෙරේරා පියතුමා
අදියුරු
"දහම් සෙවණ" දෙව්සත්හල
කළුතර

# ආස්වාදය

මත්පැනින් බේබද්දාට ද
කෝලම් කීමෙන් කෝලමාට ද
කයිවාරුවෙන් කයිවාරුවාට ද
පිළිවෙත් පිළිපැදීමෙන් බැතිමතාට ද
සල්ලාලකමින් සල්ලාලයාටද
ලිවීමෙන් ලියන්නාට ද
කියවීමෙන් පාඨකයාට ද
විහිළු මැවීමෙන් ජෝකර්ට ද
ආස්වාදයක් ලැබේ.....

සම්මත වූ මෙන්ම අසම්මත වූ ද
විවිධ විනෝදාංශ ඇත.
තම තමන්ගේ විනෝදාංශ වෙනුවෙන්
මනුෂ්‍යයන් නිර්ලෝභව වැය වෙති.

සමහර විනෝදාංශ නාස්තිකාර ය.
සමහර ඇබ්බැහිකම්
ඉතා ආස්වාදජනක වුව ද අනර්ථකාරී ය.
නීරස දුෂ්කර කාරියකැයි
අනුන්ට පෙනෙන
එහෙත් තමන්ට තෘප්තියක් ද
සමාජයට යහපතක් ද වන
විනෝදාංශ ද ඇත.

ජැන්ඩියට ඇඳ පැළඳ
ඉස්තරම් රස බොජුන් වළඳමින්
මත්පැනින් වෙරි වෙමින්
දොඩන, ගයන, නටන පාටි
සංස්කෘතික අංගයකි.
සංගීත ඝෝෂාව
දෙසවන් බිහිරි කරවනසුලුය.
මනාල යුවලට රැග් කිරීම
ගරුකටයුතු සංස්කෘතියක් වී ඇත.

කයින් පමණක් නොව
හදවතින් ද මුණගැසීම
අම්මා මිහිරක් වුවත්
එහි මිහිර නුහුරු බැවින්
මානව රොබෝවරු

සතුටෙහි ව්‍යාජ පිටපත් සඳහා
කාලය ද ශ්‍රමය ද ධනය ද
යහමින් නාස්ති කරති.

වැඩිම සතුටක්
මනුෂ්‍යයන්ට ලැබෙනුයේ
ලිංගික ආස්වාදයෙහිදී ය.
සුවය එහි අසීමිත වුවද
වින්දනය තාවකාලික ය.

ආශා සහ බලාපොරොත්තු ද
හිතේ දුර්ගුණ ද
හීන වන විට දැනෙන සැනසුම
රැඳෙයි දිගු කල් අපේ සිත් තුළ.
ඇති වනුයේ හෝ නැති වනුයේ
එය ඉතා හෙමිහිට ය.

මනුෂ්‍ය ස්වභාවය,
ලෝක ස්වභාවය සහ
ජීවිතය ගැන වූ අවදිබව
ඒ සැනසුම වර්ධනය කරයි.

රැඳෙන සතුට හීන උදවිය
කඩිමුඩි වැඩට ද
යාන්ත්‍රික වීමට ද
ඉතා දක්ෂයෝ ය.
එහෙත් විවේක සුවය
දරා ගැනීම ඔවුන්ට අපහසුය.

ආත්මයෙහි තෙරපෙන
පුස් ගඳ කොරෙහි
අසංවේදී වනු පිණිස,
විවේකය අවිවේකී කරන
තාවකාලික බාහිර විනෝදය
ඔවුන්ට නැතිවම බැරිය.

සපුගස්කන්දේ රංජිත්





# ලොතරැයියක් වූ...... තලෙන්තු

(මාර්තු - අප්‍රේල් කලාපයේ පළවූ ලිපියේ ඉතිරි කොටස)



මගේ ජ්‍යෙෂ්ඨ රංගන ශිල්පියකු චෙක්පතක් සහිතව බොහෝ සතුටින් ඉන්නවා. කාලයකට ඉහතදී ඔහු රංගනයෙන් දායක වූ විදේශීය සිනමා පටයක නිෂ්පාදන අංශයෙන් ඔහුට ලැබුණ මුදලක්, ඒ චෙක් පතේ සඳහන් වී තිබුණා. ඒ සිනමා පටයට තවත් වෙළඳ පොළකින් ලැබුණු මුදලින් ප්‍රතිශතයක් රංගනය වෙනුවෙන් අපේ ශිල්පියාට ලැබිලා වසර ගණනකට පසුවත් මෙවන් මුදලක් ගෙවීමට තරම් ඔවුන්ගේ ක්‍රමවේද සකස් වී තිබෙනවා. හැකියාව, බුද්ධිමය දේපළ ඔවුන් අගය කරනවාට පුංචි උදාහරණයක් මේ.

එහෙත් අපේ රටේ කිසියම් සිනමා පටයකට ටෙලි නාට්‍යකට, වෙළඳ දැන්වීමකට දායක වූ ශිල්පීන්ට එලෙසින් ප්‍රතිලාභ ලැබෙන්නේ නෑ. මුලින් කරන ලද ගෙවීමට අමතරව කිසිදු ගෙවීමක් යළිත් කවරදාවත් ලැබෙන්නේ නෑ. සමහර විට මුල් ගෙවීම් පවා නිසි පරිදි නොලැබෙන අවස්ථා එමටයි.

අද වන විට බොහෝ විද්‍යුත් නාලිකා, ශිල්පීන්ගේ හැකියා අවතක්සේරු කරමින් සිටිනවා. රංගනයෙන් දායක වන කටහඬින් දායක වන (Dubbing) බොහෝ ශිල්පීන්ට අදාළ ගෙවීම් කරන්නේ සමහර විට අවුරුද්දක් පමණ ගතවුණාට පසුවයි. මා දන්නා සමහර "ඩබින් ආටිස්ට්ලාට" (හඬ කැවීමේ ශිල්පීන්) සමහර නාලිකාවලින් රුපියල් ලක්ෂ හතර පහ අයවීමට ඇති බවත්, එහෙත් තවමත් නොගෙවූ නිසා නැවත එම වැඩසටහන් වලට සහභාගි නොවන බවත් පැවසුවා.

මීට අවුරුදු විස්සකට පමණ ඉහතදී එක්තරා නාට්‍ය දර්ශනයකට විදෙස් ගත වුණු අවස්ථාවක එක් සිංහල ව්‍යාපාරික මහත්මයෙක් මට හමුවුණා. ඔහු ඒ කාලේ තිබුණු "වීඩියෝ ටෙක් පීස්" ගෙන්වා බෙදාහරින්නෙක්. අපේ රටේ ප්‍රචාරය වන ටෙලිනාට්‍ය, සංගීත ප්‍රසංග, පරිසර වැඩ සටහන් ඒ රටට ගෙන්වා ශ්‍රී ලාංකික රසිකයින් හට ලබා දෙන්නෙක්. එක් "වීඩියෝ පීස්" එකක් වෙනුවෙන් ඔහු සෑහෙන මුදලක් අය කරනවා. තම මව්බිමෙන් ඈත්වි සිටින අපේ ශ්‍රී ලාංකිකයින් මේවා නැරඹීමෙන් මහත් අස්වැසිල්ලක් ලබනවා. ඒ නිසා බොහෝ විට ඔවුන් සති අන්ත නිවාඩුව ගත කරන්නේ මේ ටෙලිනාට්‍ය, ප්‍රසංග එක දිගට නැරඹීමෙන්.

"රොඩ්නි හරි නං ඔයාලා අපිට ගෙවන්න ඕනේ... ඔයාලව මෙහෙ පෙන්වනවට ..."

අප දායක වූ ටෙලිනාට්‍ය ඒ රටවලට ගෙන්වා බෙදාහැරීම වෙනුවෙන් අප ඔහුට ගෙවිය යුතුය යන්න ඔහුගේ අදහසයි. එහෙත් විය යුත්තේ ඊට ප්‍රතිවිරුද්ධ දේ නොවේද?

ඒ ඒ ටෙලිනාට්‍ය හෝ වෙනත් වැඩ සටහන් ප්‍රචාරය කරවන අදාළ නාලිකාව විසින්ම මේ වෙළෙඳපළ සකස් කරගත්තා නම් මොනතරම් වටිනවාද? ඒ ආදායම ඔවුන්ගේ විද්‍යුත් නාලිකාවට හෝ ලැබෙන්නට තිබුණා. එහෙත් වෙනත් සංවිධාන හෝ ව්‍යාපාරිකයන් එම වැඩ සටහන් නීති විරෝධී ලෙස තොගපිටින් පටිගත කර විදෙස් වෙළඳපළ වල් හිමිකරගෙන තිබෙනවා. මෙවන් නීති විරෝධී දේ අලුත් තාක්ෂණ ක්‍රමවේද ඔස්සේ අදත් සිදුවෙමින් පවතිනවා. මෙලෙසින් හැල්ලු වන්නේ අපේ රටේ ශිල්පීන්ගේ ශිල්පිනියන්ගේ හැකියාවන් හා ප්‍රතිභාවන්මයි.

**රොඩ්නි වර්ණකුල**
බෝපිටිය



## ඕං ඔහොමයි...

ඕං ඔහොමයි මේං මෙහෙමයි අපේ රටේ දැන් සිදුවන්නේ
භක්තිය වැඩිවී ශක්තිය අඩුවී ප්‍රබෝධනය නැත සිදුවන්නේ
කොරෝනා අස්සේ ගෙයි පිටිපස්සේ නිරෝධානයට සැඟවෙන්නේ
මාර වසංගත රෝග නිදන්ගත මහලු වසන්තය පැතිරෙන්නේ

යාළුවෙලා දෙව් මව්ගෙ තුරුල්ලේ උණුසුමෙනුයි ජීවත් වන්නේ
මහලු වෙලා ලෙඩ ඇඳට වෙලා දෙව් මව්ටයි මේ දුක පවසන්නේ
ගෙදරින් එලියට එලියෙන් ගෙදරට කවුරුත් නෑ අද මෙහි එන්නේ
කොරෝනා එනකොට පරානෙ යනකොට කොහොමද අපි ජීවත් වෙන්නේ

කොරෝනා තර්ජන පුරෝන මර්දන සංවර්ධන වැඩ නවතින්නේ
ඉබාගාතෙ ආ කොරෝනා නෝනා මෙහි නවතින්නයි සැරසෙන්නේ
කොරෝනා මඩින්න ගොරෝන එන්නත එනවා දැන්වත් පලයන්නේ
කොරෝනා හොරණෑ පිඹිනව තොර නෑ වද දුන්නා ඇති චුත වන්නේ

මැරිච්ච විධියට හැදිච්ච විධියට කෙරිච්ච වැඩ ටික පවසනවා
පොටිච්ච වැල් ටික හැලිච්ච ලෙසටම තාමත් ගස් යට පැල වෙනවා
ඕන්න ඔහොමයි මේන්න මෙහෙමයි හොඳපිට කනපිට පෙරළනවා
පෙරළුණ පිට හොඳයි කියනවා පිට කන අය දැන් වැඩි වෙනවා

බෙනඩික් විජේසිංහ
කඩවත

## චුට්ටා

### කලාපයෙන් කලාපයට භක්තියෙන් ප්‍රබෝධනයට ලියන

### බූටිකමට කියන කතා....

මැයි මස - වැහි මසය. වැහි මස - මල් මසය. මල් මස - පෙම් මසය. පෙම් මස - මව් මසය. මල් වලට ආස නැත්තෙ කවුද? අම්මාට ආදරේ නැත්තෙ කවුද? කවුද මේ අම්මා? අපිට අම්මලා දෙන්නයි. මගේ අම්මයි. අපේ අම්මයි. මගේ අම්මාව දෙයියො දුන්නේ. අපේ අම්මාව ජේසු දුන්නේ. බලාගෙන යනකොට ඒ අම්මල දෙන්නවම දීල තියෙන්නෙ දෙයියො නෙ.

කොළ බෙදන ආගමක අංකල්ලා දෙන්නෙක් අපේ ගෙදරට දවසක් ඇවිත් අපේ දේව අම්මාට දොස් කීවේය. පිල මත ඇණ තියාගෙන සිටි අපේ සීයාට ඒකට හොඳටම තරහ ගියේය. අපේ සීයා විගසින් නැගිට ඇවිත්, ඇසුවේ අමුතුම ප්‍රශ්නයකි. ඒක නම් අපබ්‍රංසයකි. ''ආ බං මහත්තයෝ, එහෙනම් **ආත්මය** කියන්නේ මොකක්ද කියලා පුළුවන්නම් මට කියල දියන්කො'' කියා තරමක් සැරෙන් ඇසුවේය. එවිට අසරණ වූ ඒ මහත්වරුන් ''මේ.....මේ..... මේක නෙ ලොකු උන්නැහේ, මේ....ඔය ආත්මය කියන්නේ හරියට අපේ හුස්ම වගේ අවසානයේදී අපෙන් පිටවෙලා යන වාතයක් වගේ දෙයක් නේ....'' යැයි කිවේය. එවිට අපේ සීයා එක්වරම ''ඇත්තද? ආ බං මහත්තයෝ, එහෙනම් දවසකට මගෙන් ආත්ම කීයක් පිටවෙනව ඇත්දැයි...'' විමසන විටදීත් ඒ මහත්වරුන් වාතයක් මෙන් පිටවී නතර වූයේ අපේ ගේට්ටුවෙනුත් එහාය. ''දේව අම්මා නැති ආගම් අපට මොකටදැයි'' කියමින් සීයා බුලත් විටක් අතට ගත්තේය. මේක පුදුම ලෝකයක් කියා මගේ පුංචි මොලයට ද සිතුනේය.

ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ. තු. නි. පියතුමා





අව්‍යාජ... 7 වන පිටුවෙන්.....

මරියෝත්තමාවන්ගෙනි. කානා නුවර මංගල සාදයේ දී එතුමිය ඒ නිවැසියන්ගේ ප්‍රශ්නයට සංවේදී වී, එය නිරාකරණය කරන්නට මැදහත් වූවාය. එතුමියගේ භක්තිමත් දරුවෝ ද තමන්ගේ ප්‍රශ්නයේ දී කරදර වනවාට වඩා, අන් අයගේ දුක් කරදරවලදී සරණ වන්නට උත්සුක වන්නෝ වෙති.

### 05 වර්තමාන ශ්‍රී ලංකාවේ මරිය බැතිය

ඉහත කියන්නට යෙදුණු සාධක මත පිහිටා වර්තමාන ශ්‍රී ලංකාවේ මරිය බැතිය පිළිබඳව කරුණු කිහිපයක් සඳහන් කරනු කැමැත්තෙමි.

මුලින් ම පැවසිය යුත්තේ බොහෝ රටවල් සමග සංසන්දනය කරන විට අප රටේ මරිය බැතිය ඉහළ තත්ත්වයක බවතින බවය. අවම වශයෙන් බාහිරව හෝ බොහෝ කතෝලිකයන් මරියෝත්තමාවන්ට බොහෝ සේ ප්‍රේම කරන්නන් බව පෙනීයයි. ජපමාලය උච්චාරණයේ දී, මරියෝත්තමාවන්ගේ සිද්ධස්ථාන වෙත වන්දනා ගමන් යද්දී, මරියෝත්තමාවන් හා බැඳුණු මංගල්‍යයන් සමරද්දී වැනි සියලු කටයුතුවලදී, සමස්තයක් ලෙස අප අතර ඇත්තේ සාධනීය ප්‍රතිචාරයකි.

එහෙත් අපගේ මරිය බැතිය කෙතරම් ගැඹුරු ද සහ ධාර්මිකව සාධනීය ද යන වග ද විමසා බැලිය යුතුය. අපක්ෂපපාත විමර්ශනයක දී පෙනී යන්නේ, අප ජනතාව අතර හැඟුම්බර බව බහුලව පවතින බවයි. මෙය මරිය බැතිය කෙරෙහි ද බලපාන බව පෙනීයයි. එබැවින් බොහෝ විට මෙම බැතියේ ගැඹුරකට යාමට ඇති අවශ්‍යතාවක් බැතිමතුන්ට පෙනෙන බවක් දක්නට නැත. බොහෝ අය බාහිර සහ නොගැඹුරු භක්ති කටයුතුවලින් සෑහීමකට පත්වන බව පෙනේ.

මරිය බැතියේ දේව ධාර්මික හෝ ශුද්ධ ලියැවිලිමය පදනම හෝ සභාපිය දර්ශනය ඇසුරෙන් වන පදනම හෝ සොයා බලන්නට වෙහෙසෙන්නන් අඩුය. මරිය බැතිය පිළිබඳව සාන්ත සභාවේ නිල ප්‍රකාශන කියවා අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාවක් බොහෝ අයට දැනෙන්නේවත් නැත. ගමේ මංගල්‍යයේ දී හෝ මරිය සිද්ධස්ථානයක දී හෝ සිදු කෙරෙන කථාවකින් හෝ දේශනාවකින් අහුලාගත් යමක් හැරෙන්නට මරියවේදය පිළිබඳ ගැඹුරු දැනුමක් ද බොහෝ අයට නැත. මූලධර්මවාදී අභියෝග හමුවේ බොහෝ කතෝලිකයෝ බාලාංශ දරුවන් මෙන් අසරණ වෙති. මෙය කනගාටුදායක තත්ත්වයකි. ඒ අතර බොහෝ අය තවමත් මරිය බැතියේ යෙදෙන්නේ තමන්ගේ අවශ්‍යතාවක් වෙනුවෙනි. දරුපල පතා හෝ දරුවකු ලැබීමට සිටින විට හෝ ගර්භවාස පල්ලි සොයා යන ඇතැමුන්, අවශ්‍යතාව ඉටු වූ පසු ඒ පල්ලි හඳුනන්නේ නැතුවා වැනිය. රෝගාතුරයන් රැගෙන තේවත්තේ අගෝස්තු සුව දනයේ මංගල්‍යයට යන ඇතැමුන්, සුවය ලැබීමෙන් පසුව එහි යන්නේ කලාතුරකිනි.

දරුණු සිත් වේදනා අබියස වික්ෂෝප දේවමාතාවන් සොයා යන බොහෝ අය, ඒ වික්ෂෝපයන්ගෙන් මිදුණවිට භක්ති අභ්‍යාස අත් හරිනු දැකීම දුලබ නොවේ. අවශ්‍ය වන්නේ මරිය බැතිය වඩා ස්ථාවර සහ දේව ධාර්මිකව පොහොසත් මට්ටමකට ගෙන යාමයි. ඒ සඳහා මරිය වේදයේ ඉගැන්වීම් සහ මරියෝත්තමාවන් පිළිබඳ සභා ප්‍රකාශන හැදෑරීම, මරියෝත්තමාවන්ගේ ජීවිතය නිරන්තරයෙන් මෙනෙහි කිරීම, ගැලවීම අභිරහසේ ඇයගේ භූමිකාව මෙනෙහි කිරීම වැනි අභ්‍යාසවල නිරතවීම, බොහෝ වැදගත් බව අවධාරණය කරනු කැමැත්තෙමි. මරිය බැතිය අපගේ කතෝලික අභිමානයේ සහ කතෝලික ජීවිත සතුටේ අනිවාර්ය පැතිකඩකි. එය බොහෝ කිතුනුවන්ට නැති, අපට වෙසෙසින් ලැබී ඇති ස්වර්ගීය දායාදයකි. එබැවින් එය සැබවින්ම අර්ථවත් සහ අව්‍යාජ අභ්‍යාසයක් කර ගන්නට වෙර දැරීම අපගේ යුතුකමක් ලෙස සලකමු.

# වාක් ප්‍රසාද ගැබයෙනි.....



මෙම ප්‍රාර්ථනා බොහොමයක් විශේෂයෙන් දේවමාතා ප්‍රාර්ථනාව මූලික ලතින් භාෂාමය ප්‍රාර්ථනාවල සිංහල පරිවර්තනය විය. මුළු ප්‍රාර්ථනාවේ ගීතමය කොටස් ගෙනහැර දැක්වීමට වඩා බෙහෙවින් විවාද සම්පන්න වූ යෙදුම් දෙකතුනක් කෙරෙහි විමසුම් සිත යොමු කිරීම මෙම ලිපියෙහි මුඛ්‍යාර්ථය වේ.

**ශ්‍රේෂ්ඨ** (සමහර පිටපත්වල **ශ්‍රේෂ්ඨී**) **ඇදුරාගේ මාතාවෙනි** (දැන් සමහර පොත්වල එය **මැවුම්කාරයාගේ මාතාවෙනි** යනුවෙන් භාවිත සිංහලෙන් මුද්‍රණය කොට තිබේ.) සහ **වාක් ප්‍රසාද ගැබයෙනි, පව්කාරයන්ගේ අඩක්කලමෙනි** යනු එම කොටස් ය.

**ශ්‍රේෂ්ඨ ඇදුරාගේ මාතාවෙනි** යන්නෙහි මූලික ලතින් යෙදුම 'MATER CREATORIS' වන අතර එහි ඉංග්‍රීසි යෙදුම 'MOTHER OF CREATOR' යනුවෙන් වේ. සංස්කෘත සාහිත්‍ය අනුව විශ්ව මැවුම්කාරයා මහා බ්‍රහ්මයා වේ. සිංහල සාහිත්‍යයේ මහා බ්‍රහ්මයාට (ලෝකයේ මැවුම්කරුට) ලොවැදුරු නම ද භාවිත වේ. එබැවින් ශ්‍රේෂ්ඨ ඇදුරාගේ මාතාවෙනි යන යෙදුම ගැලපේ (ස්‍රෂ්ටෘ සංස්කෘත වචනයයි).

මේ අනුව ශ්‍රේෂ්ඨ ඇදුරාගේ මාතාවෙනි යනුවෙන් අමතනු ලබන්නේ දේව මාතාවන් වන නිර්මල කන්‍යා මරිය උත්තමාවන් ය. මෙහි දී මා නිහතමානීව අවධාරණය කරන්නේ අප යාච්ඤා කරන විට දී ගිරවුන් සේ කට පාඩම් වූ වචන ප්‍රකාශ කිරීමට වඩා එම යෙදුම්වල අන්තර්ගතය අර්ථය වටහාගෙන අවදි වූ භක්තියෙන් යාච්ඤා කිරීම සුදුසු බවය.

**පව්කාරයන්ගේ අඩක්කලමෙනි** යන්නෙහි අඩක්කලම යන ද්‍රවිඩ වචනයෙහි අරුත රක්ෂාස්ථානය යන්නයි. අදත් අඩක්කලමෙ දේවස්ථානය යනුවෙන් දෙව්මැදුරක් මීගමු කොච්චිකඩේ ආසන්නයේ පිහිටා තිබේ.

දැන් මෙම ලිපියෙහි ප්‍රස්තුතය වන "**වාක් ප්‍රසාද ගැබයෙනි**" යන යෙදුම සලකා බලමු.

ලෝකයේ ප්‍රචලිත හැම ආගමකම පාහේ ප්‍රශස්ති ගීත ගායනා ඇතුළත්ව තිබෙන බව දක්නට ලැබේ. එය ඒ ඒ ජාතීන්ට ආවේණික වූ සාහිත්‍යයේ ආභාසය ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස සැලකිය හැකිය. ක්‍රිස්තියානි ආගමේ ද එවැනි ප්‍රශස්ති ගීත බෙහෙවින් දක්නට ලැබේ. ශුද්ධ බයිබලයෙහි ඇතුළත් ගීතාවලිය, ප්‍රේම ගී හෙවත් සලමොන්ගේ ගී සහ විලාප ගී ඊට නිදසුන් වශයෙන් දැක්විය හැකිය.

අපගේ ක්‍රිස්තියානි යාච්ඤාවල විශේෂ අංගයක් වන විවිධ ප්‍රාර්ථනාවල දී බෙහෙවින් ඇතුළත්ව තිබෙන්නේ ප්‍රශස්තිමය යෙදුම් ය. දේවමාතා ප්‍රාර්ථනාවේ මෙබඳු ගීතමය කොටස් බහුලය. එවැනි ප්‍රශස්තිමය ප්‍රබන්ධ අපගේ ශ්‍රවණයට මඳක් නුහුරුව පවත්නේ ඒවා අපට දායාද කළ සංස්කෘත භාෂා විශේෂඥ පූජක ජාකෝමේ ගොන්සාල්වෙස් වැනි උතුමන්ගේ භාෂා ශෛලිය නිසාය.





ගිවිසුම් කරඬුව තුළ තැන්පත් කරනු ලැබුවේ දෙවියන් වහන්සේගේ වචනය හෙවත් දසපණත ඇතුළත් ගල් පුවරු අඩංගු කළ මංජූසාවයි. එමෙන්ම පාළුකරයේදී ඉශ්‍රායෙල් ජනතාවට ලැබුණු මන්නා සහ ඔවුන්ගේ පූජකයකු වූ ආරොන්ගේ යෂ්ටිය ද එහි අන්තර්ගතය. එය ඉශ්‍රායෙල්වරුන්ගේ පූජනීයත්වයට යොමු වූ ශුද්ධ වූ වස්තුව විය. දස පණතට අනුව ජීවත් වීම දිව්‍ය සංරක්ෂණය ලැබීමේ ගිවිසුම් සහතිකය විය. පුරාණ ගිවිසුමේදී දේව වචනය ගිවිසුම් කරඬුව තුළ අන්තර්ගත වුවත් අලුත් ගිවිසුමේදී මනුකය රැගෙන දේව වචනය අප අතර ජේසු ක්‍රිස්තුන් වහන්සේ ලෙස ජීවත් වූ සේක.

ශුද්ධවර ජොහාන් තුමා සිය සුබාරංචිය අරඹනුයේ වාක්‍යයාණන් හෙවත් දේව වචනය දෙවියන් බවත්, මැවීමේ කාර්යයේ දී මූලික වූ බවත් ප්‍රකාශ කරමිනි. ජේසු සමිඳාණන්ගේ උපත පිළිබඳ පුවත නමෝ විත්තියෙන් ම දැන්වීමට පැමිණි දේව දූතයාගේ වදන් වුණේ "**විපුල ප්‍රසාද ලත් උත්තමිය, ඔබට මංගල වේ. ස්වාමීන් වහන්සේ ඔබ සමගය**" යනුවෙනි. එහි නියම අරුත වුණේ කුමරි මරියාවන්ට දේව දූතයා පළකළ පරිදි සිය කුසෙහි මනුකය ගත් දේව වචනය දරා ගත්තේ දේව මාතාවන් වන බවය.

දේව දූතයාගේ බස් අසා කුමරි මරියාවන් එලිසබෙත් තුමිය බැහැ දකින්නට ගිය අවස්ථාවේ දී එලිසබෙත් තුමියගේ ප්‍රශංසාත්මක ආචාරශීලී වදන් වුණේ "**ඔබ වනිතාවන් අතර අතිශයින් ආශිර්වාද ලද්දෙහිය. ඔබ කුසඔත් දරු පලය ද ආශිර්වාද ලද්දේය. මාගේ ස්වාමීන් වහන්සේගේ මෑණියන් මා වෙත පැමිණීමට තරම් මා කවරෙක්ද?**" යන ශුද්ධාත්මානුකූල ප්‍රකාශයයි. මේ සියලු කරුණු කැටිකර ගත් විට මෙතෙක් ප්‍රකාශිත වාක්දාත සිය නොකැළැල් ශරීරය තුළ අන්තර්ගත කරනු ලැබූ කුමරි මරිය උත්තමාව වාක් ප්‍රසාද ගැබය හෙවත් දේව මාතාවන් බව පිළිගෙන ගෞරවාදර දැක්වීම යුක්ති යුක්ත බව ප්‍රකාශ කළ හැකිය.

**වෙන්නප්පුවේ පයස් ප්‍රනාන්දු**

# කවි පඬුරක්

අකුරක් නෑර ලියවෙනකොට මේසෙ මත
ඔබ මිණි නුවන සමඟින් පැටලෙයි මසිත
නොනැවත එතැන සිතිවිලි ලියවැල් පිබිද
නන් නන් දෙසට නවතාවෙන් යයි ඇවිද

ජේසුනි ඔබේ කිරිමුව හසරැල් කමල
කෑවත් මට පෙනෙයි යනකොට දැලි රැවුල
ගව ඔරුවක එදා සැතපුණ හිරු මඬල
සත සුව සදන අරුණක් වුවා නිමල

පැණසර ඔබේ වත මා නෙත ගැටෙන විට
හිරිමල් වියේ කොලු ගැටයකු එයි සිතට
පණ්ඩිත සභාවක් මැද සිට වාද කොට
පෑ පෙළහර එදා මංපෙත විය ලොවට

විහිදෙන තියුණු බැල්මෙහි තව යමක් සොයා
මගෙ හිත ඈත කිතු වසරෙහි මුලට ගියා
ඔබෙ පාමුල වැටී අඟනක් කඳුළු තියා
කී දුක ලොවට නව දෙසුමක් වී වැඩියා

ජේසුනි ඔබව යළි දවසක මුණ ගැසුනා
ඔබෙ රුව ලකුණ පණ හදවත් වල කෙටුනා
මව්නට ඇති සෙනේ දරුවකුගේ අගනා
මිදියුෂ මවපු දිනයේ යළි පළ කෙරුනා

මරණය පෙනි පෙනී චංචල නොවන සිත
ඔබගේ නිසල මුහුණින් මතු වෙයි නැවත
ලේ වැකි වණ කැළැල් කටු කඩුවල මුහත
ජේසුනි ඔබට නව දිරියක් වන්න ඇත

ශාන්ත කටුකුරුන්ද

# නමෝ මරියනී...



මැතකදී එක්තරා ගැහැනු දරුවකු මන්නා පිහි පහරකට ලක්ව දැත වෙන්වී ඉතා දරුණු ලෙස තුවාල වී රෝහලට විත් ශල්‍යාගාරයේ අබියස මිමුනූ වදන් මොනවාද?

ඇයට දරුණු ලෙස, හිසට, දැතට, පිටට හා කොන්දට බරපතළ පිහි පහර, පිට පහර එල්ල වී අධික රුධිර වහනය වී ඉතා අවාසනාවන්ත ලෙස අසරණව සිටි බව ඕනෑම කෙනකුට තේරුම් ගත හැකිය. ලහි ලහියේ ශල්‍යකර්මයට සූදානම් වූ අප හට ඇසුණේ නමෝ මරියනි යාච්ඤාවයි. එකම කතෝලිකයා වූ මම ශල්‍ය කණ්ඩායමෙන් මිදී රෝගියා වෙත හැරී මගේ කොන්තයත්, කුරුසියත් ඇයට පෙන්වා සුළු යාච්ඤාවක් කර ඇ දිරි ගන්වා දේව මාතාවන්ට කන්නලවු කළෙමි. පැය ගණනාවක ශල්‍යකර්මයකින් පසු ඇ ප්‍රකෘති තත්ත්වයට හා නැවත ජීවිතය ලද අතර මා හට දේවමාතාවන් එදා දැක්වූයේ එතුමියගේ දයාව පතන කවරකු වුවද හිස් අතින් නොයවන ප්‍රාතිහාර්යයි.

දේව මාතා භක්තිය හා දේවමාතාවන්ගෙන් අප ඉල්ලූ සාධාරණ කිසිවක් එතුමිය නොදී නැති අතර ඉතාමත් තීරණාත්මක මොහොතවලදී අප දේවමාතා සරණ එකිනෙකා අත් දැක ඇත. ඉන් විශේෂ එක් සිද්ධියක් වනුයේ, V පියුස් පාප්වහන්සේ ශුද්ධාසනය හොබවන කල (1566-1572) ඔටෝමාන් තුර්කිවරු ඉතා බලවත්ව ඉතාලිය ප්‍රමුඛ බටහිර රටවලට ඉතාමත් දරුණු තර්ජනයක් වූහ. මධ්‍යධරණී මුහුදේ බලය නතුකරගත් ඔටෝමාන් අධිරාජ්‍යය ඉතාලියේ වෙරළ ආශ්‍රිත නගරවලට අති මහත් තර්ජනයක් කළහ. ඉතාලිය ඇතුළු ක්‍රිස්තියානි ලෝකයේ රටවල් (යුරෝපය) සුල්තාන් සලීම් (II) අල්ලා ගැනීමට ඉතා ආසන්න තත්ත්වයක තිබිණි. ශුද්ධෝත්තම පාප් තුමා මේ ගැන ක්‍රිස්තියානි ලෝකය දැනුවත් කර සහාය ඉල්ලමින් යුරෝපය තුළ වන්නට යන ක්‍රිස්තියානි සමූලඝාතනය වළකන්නට දේවමාතා යැදීම ඉතා තදින් පටන් ගත්තේය.

මේ අතරේ යුරෝපා හමුදා දොන් ජුවන් (ඔස්ට්‍රියාව) යටතේ 1571 වර්ෂයේ සාදාගත හැකි වූයේ තුර්කි අධිරාජ්‍යට වඩා ඉතා සුළු හමුදා හා නැව් ප්‍රමාණයකි. උදව්වට ආවේ වැනීසිය, නේපල්ස්, ජෙනෝවා, ස්පාඤ්ඤ හා මෝල්ටා භටකාණ්ඩ පමණකි. සතුරා නැවැත්වීමට මෙය ප්‍රමාණවත් නොවීය. ප්‍රංශය හා එංගලන්තය යුද්ධයක පැටලී හෙම්බත් වී අතර එංගලන්තයද අයර්ලන්තය හා යුද්ධයකය. බටහිර යුරෝපය හා නැගෙනහිර යුරෝපයේ විරසක නිසා ලහිලහියේ හමුදා ජර්මනියේ හෝ ස්කැන්ඩිනේවියානු රටවල හමුදා ගෙන්වීමේ ඉඩ අවමය. මේ අතර තුර්කි සලීම්ගේ නැව් බලය 230 ක් හා පාබල හමුදා 120 000 කි. ඔක්තෝම්බර් 7 වන විටදී යුද්ධය තදින් ඇවිලී ගිය අතර ක්‍රි.පු. 480 තර්මෝෂීලියා යුද්ධය සිහිගන්වමින් තම ක්‍රිස්තියානි දේශයත් රැක ගැනීමට දේවමාතාවන් යැද, සොල්දාදුවෝ





අභීතව යුද්ධ කළ අතර ග්‍රීක වෙරළ ආශ්‍රිතව අප කවුරුත් දන්නා කොරින්තියේදී (ඉතිහාසඥයන් ලෙපාන්තෝ සටන/Gulf of Lepanto [Corinth]) සුවිශාලතම ජයග්‍රහණය අත්කරගත් හමුදා 12000 පමණ ක්‍රිස්තියානින් වහල් බවින් මුදා මහා සලීම්ව අත්අඩංගුවට ගත්හ. මෙම දේව මාතා මැදිහත්වීම වූ ඓතිහාසික දිනය පාප්වහන්සේ විශේෂ දිනයක් කළ අතර පසුව ග්‍රෙගරි (VIII) පාප්වහන්සේ එම දිනය ශු. ජපමාලය සඳහාම වෙන්කළ ශුද්ධ වූ දිනයක් කළ සේක.

In commemoration of Lepanto, Pope Pius V established a feast in honour of our lady of victory. Later Gregory XIII changed it to the feast of the Most Holy Rosary, celebrated on October 7th.

යුරෝපය තුළ ව්‍යාප්ත වූ කිතුනු දහමින් යුරෝපය අතිශයින් බලවත් වී ගිය අතර දේව ආශිර්වාදය නිසා ඉහළ පුනරුදයකට පත්වී අනිකුත් මහද්වීපවල ජනයාට වඩා විශේෂ විය. රජවරුන් පමණක් සැප විඳින සෞභාග්‍යයට වඩා පුද්ගල සංවර්ධන හා මානව උදාරත්වය හා පිළිගත් ජයග්‍රණයකි. පසුව මධ්‍යතන යුගයේ යම් යම් විශ්වාසයේ හීන වීම හා වරප්‍රසාදිත වූ කිතුනුවන්, විවිධ නිකාය භේද හරහා වූ පසුබෑම් නිසාත්, වස්තු කාමය ඉහවහා යාමත් නිසා යුරෝපා රාජ්‍ය තුළ විරසක වලින් නිසි පල ගත්තේ, පුද්ගල හා මානව උදාරත්වය අගය නොකෙරුණු ගෝත්‍රික අදහස් හා පුරුෂයන් පමණක් ලොව සිටිය යුතුයි යන මත දරන පර්සියානු ව්‍යාප්ත වාදයයි.

අදටත් ඉතිහාසය නැවත පුනරාවර්තනය වෙමින් ඇත. යුරෝපයේ තැන තැන කතෝලිකයන් හා කතෝලික සිද්ධස්ථාන ඉලක්ක කරගත් ප්‍රහාර හා අප පාස්කු ඉරුදින වූ ඛේදයන් එහි ප්‍රතිඵල ලෙස මට හැඟේ. ගෝත්‍රික මත තවම කරපින්නාගත් කාන්තාවන් තවදුරටත් පුරවැසියන් ලෙස නොසිතන හිස කඳින් වෙන් කරන නීතිය මුදුනේ තබාගත් ම්ලේච්ඡත්වය අදටත් ඇත. කිතු උපතට කලින්ද උක්ත සඳහන් කළ ක්‍රි.පූ. 480 දී පමණ තර්මෝෆීලියා තීරණාත්මක සටන හා දේවමාතා මැදහත්කම තදින් අත්දුටු ලෙපාන්තෝ සටනද අපට පෙන්වන්නේ මානව උදාරත්වය හා කාන්තා විමුක්තියත් අප ආරක්ෂා නොකොළොත් ඉදිරියේ ඉතා දැඩි ඛේදාන්තවලට මුහුණු දිය හැකි බවයි. මීට දේවමාතාවන් මැදිහත්වන්නේ, උන්වහන්සේ අපට ඇති මහා කාරුණික මාතාව නිසාය. එතුමිය දේවමාතා රාජේශ්වරිය වන්නේ, ලොව පුරාම විවිධ ස්ථානවල දර්ශනය වෙමින් කුඩා දරු දැරියන්, වැඩිහිටියන් සමඟ ඒකාත්මික වෙමින් පව්කරුවන්ගේ සිත්හැරෙන්නට යාච්ඤා කරන්නට විශ්වාසකයන්ගෙන් එන ආයාචනය නිසාමය.

ලොව පුරා හැම රටකම පාහේ එතුමියගේ විශ්වාසීන්ව ක්‍රිස්තුස් වහන්සේ වෙතට ගෙන යන දර්ශන වාර්තා වී සිතියම් ගත කර ඇත. එපමණක් නොව මානව වර්ගයාගේ අනාගතය තුළ වන විශාල විපත්තීන්ට පෙර විශ්වාසය ශක්තිමත් කිරීමත් ඉන් ගැලවීමටත් දේව මාතා මැදහත්කම නොමදව දානය කර ඇත. මාගේ විශ්වාසයේ හොඳම උදාහරණයත්, අනතුරු ඇඟවීමත් ඇති එක් විශේෂ, ලිඛිතව සඳහන් දේවමාතා දර්ශන හා විශ්වාසයේ අවස්ථා 3 ක් ඇත. ඒ 1830 දී ප්‍රංශයේ පැරිස්වල පුදුම පදක්කම හා සබැඳි දර්ශන පෙළද, 1846 දී ප්‍රංශයේම සාලිස් කන්දේ දර්ශනයද, 1858දී ලූර්දුවේදී වූ නිර්මල මරිය පිළිසිඳ ගැනීම සබැඳි දර්ශනද වේ.

මින්පසු ප්‍රංශයේ සිදුවූ විනාශයන් බටහිර ඉතිහාසය හොඳට අධ්‍යයනය කළ ඕනෑම කෙනකුට හිතා ගත හැකිය. 1789 සිට 1799 දක්වා වූ ප්‍රංශ විප්ලවයේ ආගම හා විශ්වාස ගැන ප්‍රශ්න කෙරූ අතර ප්‍රතිඵලය දරුණු වූයේ පාන් නැත්තම් කේක් කන්න උපදෙස් දුන් ඇන්ටනට් රැජිනට

21 වන පිටුවට.....

**වෛද්‍ය සචිත මිලින්ද මෙන්ඩිස්**
ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී උ.කො.
ශික්ෂණ රෝහල
රාගම

# මරිය තුමියට තවත් දරුවෝ සිටිත් ද?

"සමූහයක් උන්වහන්සේ අවට වාඩි වී උන්හ. ඔවුහු, 'අන්න ඔබේ මෑණියෝත්, සහෝදරයෝත්, සහෝදරියෝත් පිටත සිට ඔබ සොයති' යි උන් වහන්සේට කීහ" (මාක් 3:32).

ඉහත දැක්වෙන බයිබල් පාඨය උපුටා දක්වමින් මරියෝත්තමාවන්ට තවත් දරුවන් සිටියෝය යන්න මූලධර්මවාදීන් පවසන විට ඇතැම් රෝමානු කතෝලික බැතිමතුන් නිරායාසයෙන්ම කලබල වෙති. මෙහි තිබෙන්නාවූ බයිබලීය පසුබිම නිවැරදිව අවබෝධ කර ගැනීමකින් තොරව මෙවැනි ප්‍රකාශනවල ඇති අසත්‍යය තේරුම් ගත නොහැකිය.



කිතු දහමේ මුල් අවධියේ සිටම ජේසුස් වහන්සේගේ මාතාවන් ජීවිත කාලය පුරාම කන්‍යාවක් ලෙස පිළිගත් බව ඉතිහාසය සාක්ෂි දරයි. රෙපරමාදු ප්‍රතිසංස්කරණවාදීන් ලූතර්, කැල්වින් සහ සුවින්ග්ලි යන සියලු දෙනා පවා මරිය තුමිය සදාකාලික කන්‍යාවක් බව ඉගැන්වූහ. එය එසේ නම් ජේසුස් වහන්සේගේ සහෝදර සහෝදරියන් ලෙස බයිබලය සඳහන් කරන විට එයින් අදහස් වනුයේ කුමක් ද?

"මොහු වඩුවා නොවේ ද? මරියාගේ පුතා නොවේ ද? ජාකොබ්, ජෝසෙප්, සහ සීමොන් යන අයගේ සහෝදරයා නොවේ ද? මොහුගේ සහෝදරයනුත් අප අතර සිටිනවා නොවේ ද?" (මාක් 6:3).

ඉහත පාඨය කියවන විට ඔවුන් ජේසුස් වහන්සේගේ එක කුස උපන් සහෝදරයන් ලෙස කෙනකුට හැඟී යා හැකිය.

මෙවැනි ගැටලු සහගත පාඨවලින් මතුවෙන දෙගිඩියාව අප ඥානවන්තව විසඳා ගත යුත්තේ කෙලෙස ද?

ශ්‍රී ලාංකික සමාජයේ මෙන්ම ඉපැරණි ජුදා සමාජයේද අක්කා, අයියා, නංගී, මල්ලී යන පදවලින් පවුලේ සහෝදර සහෝදරියන් මෙන්ම සමීප ඥාතීන් ද, අමතා ඇති බව දැක ගත හැකිය.

එපමණක් නොව අප ජීවත් වන වර්තමාන සමාජය තුළ පවා ස්වාමිපුරුෂයා සහ භාර්යාව ඔවුනොවුනට අයියා නංගී ලෙස අමතන යුවල ද අපට හමු වෙති.

හෙබ්‍රෙව් බසින් ලියවුණු බයිබලය ද, ඥාතීන්ට "සහෝදරයන්" ලෙස ආමන්ත්‍රණය කර ඇත. (උත්පත්ති 14:16; 29:12-15, ලෙවී ව්‍යවස්ථාව 10:4) එහෙත් සිංහල බයිබල් පරිවර්තනයේදී (ලෙවී ව්‍යවස්ථාවේ පාඨය තුළ "සහෝදරයන්" ලෙස ඇතත්) උත්පත්ති පොතේ පාඨ දෙකේදී "ඥාතීන්" යන පදය යොදාගෙන ඇත.

මාක් තුමාගේ සුවිශේෂය තුළින් ඉහත ඉදිරිපත් කළ (මාක් 6:3) පාඨයේ සැබෑ යථාර්ථය මතෙව් සුවිශේෂය හරහා අපි පැහැදිලි කර ගනිමු.

"මොහු වඩුවාගේ පුතා නොවේද? මොහුගේ මවගේ නම මරියා නොවේද? මොහුගේ සහෝදරයෝ ජාකොබ්, ජෝසෙප්, සීමොන් සහ ජූදස් නොවෙත් ද? මොහුගේ සියලු සහෝදරියෝත් අප අතරෙහි නොවෙත් ද?" (මතෙව් 13:55-56).





මතෙව් සුවිශේෂයෙන්ම එන පහත පාඨය හරහා ජාකොබ් සහ ජෝසෙප්, මරියා නම් වූ වෙනත් කාන්තාවකගේ දරුවන් බව පැහැදිලිවම සඳහන් කළ හැකිය.

"මග්දලායේ මරියා ද, ජාකොබ් සහ ජෝසෙප්ගේ මව වූ මරියා ද, සෙබදිගේ පුත්‍රයන්ගේ මවද ඔවුන් අතර වූහ" (මතෙව් 27:56).

එබැවින් ජේසුස් වහන්සේට, ඔවුන්ගේ ඥාති සම්බන්ධතාව කෙසේද යන්න නිවැරදිව ප්‍රකාශ කරන්නට නුපුළුවන් වුවද මරිය තුමියගේ කුසයෙන් ඉපදුණ දරුවන් නොවන බව නම් පැහැදිලිය. ඒ අනුව ගත් කල "සහෝදරයන්" යන පදය ඥාති සහෝදරයන් සඳහා යොදාගත් බව මෙයින් ගම්‍ය වේ.

තවත් නිදසුනකට අනුව ජීව විද්‍යාත්මකව එක කුස උපන් පවුලේ සාමාජික සාමාජිකාවන් නොවුණත් මුල් කිතුනු සංඝය එකිනෙකාට සහෝදර සහෝදරියන් ලෙස අමතන අයුරු ප්‍රේරිතවරුන්ගේ ක්‍රියා පොත තුළ විද්‍යමාන වේ (ක්‍රියා 15:13).

තවත් සංකීර්ණ තත්ත්වයක් නිර්මාණය කරන වගන්තියක් වනුයේ,

"එහෙත් ඇයට පුත්‍රයා **ලැබෙන තුරු** ඇය සමඟ එක් නොවීය. ඔහු උන්වහන්සේට ජේසුස් යන නාමය තැබීය" (මතෙව් 1:25).

පුත්‍රයා '**ලැබෙන තුරු**' ජුසේ තුමා මරියෝත්තමාවන් සමඟ එක් නොවීය යන්නෙන්, පුත්‍රයා 'ලැබුණු පසු' එලෙස එක්වූවාය යන්නට කිසිසේත් ඉඟියක් ලබා නොදෙයි. මතෙව් සුවිශේෂකවරයා අවධාරණය කරන්නේ ජුසේ තුමා මරිය තුමිය සමඟ වෛවාහික (Conjugal love) සම්බන්ධතාවක් තුළ ජේසුස් වහන්සේව මෙලොව ජනිත නොකළේය යන්නය. ජුසේ තුමාගේ ස්වාභාවික පුත්‍රයකු ලෙස මෙලොවට බිහි නොවන නිසාම ජේසුස් වහන්සේ ජුසේ තුමාගේම පුතකු නොවනු ඇත. එහෙත්, ජේසුස් යන නාමය ලබා දෙමින් එතුමා උන්වහන්සේගේ සුරැකි පියා වී ඇත (මතෙව් 1:25)."

එවැනි වූ අදහසක්, මතෙව් සුවිශේෂයේම අවසානයේදී ද අපට හමුවෙයි. ජේසුස් වහන්සේ මෙසේ පවසන සේක: "මම යුගාන්තය දක්වා සදහට ම ඔබ හා සමඟ සිටිමි" (මතෙව් 28:20). යුගාන්තය "**තුරු**" සිටිනවා යැයි කීමෙන් අදහස් කරන්නේ ඉන්පසු උන්වහන්සේ නොසිටින බව නොවේ. ඒ ආකාරයෙන් "**තුරු**" යන පදය යොදාගත් අවස්ථා රැසක් අපට ශු. බයිබලය පුරාම දක්නට ලැබේ.

ජේසුස් වහන්සේට ඇයගේ කුළුඳුල් පුත්‍රයා ලෙස ආමන්ත්‍රණය කළත් (ලූක් 2:7) මරිය තුමියට තවත් දරු දැරියෝ සිටියෝය යන්න ඉන් අදහස් නොකරයි. බයිබලීය සංස්කෘතිය තුළ කුළුඳුලා ලෙස සලකනු ලබන්නේ කාන්තාවකගේ ගර්භාශයෙන් එළියට පැමිණෙන පළමුවන දරුවාය (නික්ම. 13:2). එබැවින් මෝසෙස්ගේ නීතියට අනුව අන් දරුවන් උපදින්නට පෙර කුළුඳුල් දරුවා සමිඳාණන් වහන්සේට කැප කිරීම විගස කළ යුතුය (නික්ම. 13:2, 12, 15; 1 ලූක් 2: 21-24). එනිසා ජේසුස් වහන්සේට කුළුඳුල් පුත්‍රයා ලෙස ඇමතීමෙන් මරියෝත්තමාවන්ට තවත් දරුවෝ සිටියෝ ය යන්න කොහෙත්ම අදහස් නොකෙරේ.

හෙබ්‍රෙව් බයිබලය තුළ සහ ඉපැරණි අසල්වැසි නැගෙනහිර සංස්කෘතිය තුළ ද, පහත දැක්වෙන කාණ්ඩ තුනේ කුළුඳුල් පල පවිත්‍ර යැයි සහ දෙවියන් වහන්සේ සතු යැයි සලකනු ලැබුවේය:

1. ඉපදෙන ප්‍රථම පිරිමි දරුවා (නික්ම. 13:12-15, ගණන් කථාව 18: 15-16)

2. නාඹුල් පල (නික්ම. 23:19 , ලෙවී ව්‍යවස්ථාව 23: 10, ගණන් කථාව 15: 20-21, ද්වීතීය නීති සංග්‍රහය 26:1-11), ආහාර පාන ඇතුළු අන් සියලුම දේවල් නිෂ්පාදනයේ දී (ගණන් කථාව 18: 12-13, ද්වීතීය නීති සංග්‍රහය 18:4, එසකියල් 44:30).

3. සියලුම සතුන්ගේ කුළුඳුල් පිරිමි පැටවුන් (නික්ම. 13:12-13, ලෙවී ව්‍යවස්ථාව 27: 26-27, ගණන් කථාව 18: 16-18, ද්වීතීය නීති සංග්‍රහය 15:19-23)

අස්වැන්නේ නාඹුල් පල දෙවියන් වහන්සේට පිදීම, මහ පොළොව උන්වහන්සේට අයිති බව අවබෝධ කර ගැනීමට ඇති කරන ලද ආගමික පිළිවෙතකි (ගීතා. 24:1). ඉශ්‍රායෙල් ජනතාවගේ සියලු මිනිසුන් සහ සත්ව කුළුඳුලන් මුදාගෙන (නික්ම. 13:14-15) වසංගතයෙන් ගලවා, වහල් කමින් නිදහස් කර, ඔවුන්ව දෙවියන්

වහන්සේගේ කුළුඳුල් ජනතාව කර ගත් සේක (නික්ම. 4:22, ජෙරමියා 2:3). ඒ අනුව සියලුම පිරිමි කුළුඳුල් දරුවන් දෙවියන් වහන්සේට ඔප්පු කළහ. මිනිස් ජීවිත යාග කිරීම ඉශ්රායෙල් හි තහනම් නිසා පාප කමාකිරීමේ සලකුණක් ලෙස කුළුඳුල් සතුන් පූජා කළෝය (ලූක් 2:22-24).

ඉශ්රායෙලයේ කුළුඳුලාට ලැබෙන මෙම ඉහළ තත්ත්වය, සමාජ-නීතිමය රාමු තුළද පිළිබිඹු වේ. කුළුඳුල් දරුවාට පියාගේ දේපලින් දෙගුණයක් උරුම වෙයි (ද්වීතීය නීති සංග්‍රහය 21:15-17, යෙසායා 61:7). පිතෘක ආශීර්වාදය ලැබෙන්නේද (උත්පත්ති 27), පරපුරෙන් පරපුරට ගලා එන අධිකාරිත්වය ලැබෙන්නේ ද (උත්පත්ති 27:29, 37; 37:21-22, 2 රාජාවලිය 2:9) ඔහුටය.

"දාවිත්ගේ පරපුරෙන් පැවත එන රජු" (Davidic King) යන රූපකයෙන්ද දෙවියන් වහන්සේගේ කුළුඳුල් දරුවා යන්න සංකේතවත් කරයි (ගීතා 89:27-28). එනිසා මෙම නාමය නව ගිවිසුමේදී ජේසුස් වහන්සේට ආමන්ත්‍රණය විය (හෙබ්‍රෙව් 1:6).

ජේසුස් වහන්සේ මරියාවන්ගේ එකම පුත්‍රයා ය. එනමුත් ඇයගේ ආධ්‍යාත්මික මව් පදවිය ජේසුස් වහන්සේ විසින් ගලවා ගැනීමට පැමිණි හැම මිනිසකු වෙතම ව්‍යාප්ත කෙරේ. ජොහාන් තුමා ඉදිරිපත් කරන කුරුසිය පාමුල සිද්ධිය මෙය සනාථ කරයි (ජොහාන් 19:25-27). ජේසුස් වහන්සේ ඇදහිල්ලේ සංඝයක් ස්ථාපනය කරන අතර උන්වහන්සේගේ ප්‍රේමවන්තම ශ්‍රාවකයාව බාර දෙන්නේ තමන් වහන්සේගේ ප්‍රේමවන්ත මෑණියන්ටය. මෑණියන් ප්‍රේමවන්තම ශ්‍රාවකයාට බාර දෙයි. ඒ අනුව මරිය අම්මා ක්‍රිස්තුන් වහන්සේට ප්‍රේම කරන සියලු අනුගාමිකයන්ගේ මෑණියන් වශයෙන් හඳුන්වා දෙන සේක.

ඉතා ප්‍රායෝගික කරුණක් පාඨකයන්ගේ අවධානයට යොමු කරමි. ජේසුස් වහන්සේට සැබවින්ම එක කුසේ උපන් සහෝදර සහෝදරියෝ සිටියෝ නම් ඔවුන් ක්‍රිස්තුන් වහන්සේව එල්ලා මරණ විට හා උත්ථානයෙන් පසුවත් තමන්ගේ ලේ නෑකමේ අනන්‍යතාව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීම නිරායාසයෙන්ම සිදු විය යුත්තකි. එවැන්නක් සිදුවූ බවක් වාර්තා නොවේ. එසේ සිටියා නම් අද ඔවුන්ද කතෝලික සභාවේ ශුද්ධවන්ත ශුද්ධවන්තියන්ගේ නාමාවලියට එකතු වී හමාරය.

මරියාවන් සදාකාලික කන්‍යාවක් යන්න අභිධර්මයක් [වේද සත්‍යතාවයක් (Dogma); දෙවියන් වහන්සේ විසින් අනාවරණය කරන ලද, ශුද්ධෝත්තම පියතුමන් විසින් තම නිල බලය තුළ ප්‍රකාශයට පත්කරන ලද සත්‍යතාවයක් මෙයින් අදහස් කෙරේ] ලෙස ක්‍රමානුකූලව ගොඩනැඟීමේ ආරම්භය හතරවන ශත වර්ෂයට විහිදේ. කතෝලික සභා ධර්මෝපදේශය මේ පිළිබඳව ඉගැන්වීම පහදා දෙයි. (ක.ස.ධ.) 496-507, 510. 18 සහ 19 ශතවර්ෂවලදී මූලධර්මවාදීන්ගේ ආගමනයත් සමග ඔවුන් " මරිය තුමියට දරුවෝ සිටියෝය" වැනි මීට ඉහත කිසිවකු අසා නොමැති ප්‍රශ්න මතු කළෝය. මෙහිදී මූලධර්මවාදීන්ගේ මුඛ්‍ය පරමාර්ථය කතෝලික සභාවේ ඉගැන්වීම් සහ ඇදහිල්ල මෙවැනි සාවද්‍ය තර්ක හරහා අභියෝගයට ලක්කරමින් කතෝලික ජනතාව නොමග යැවීමට දරන උත්සාහයක් දැයි අපට සාධාරණ සැකයක් මතුවේ. එබැවින් මූලධර්මවාදීන්ට දෝෂාරෝපණය කරනවාට වඩා කතෝලිකයන් කළ යුත්තේ ඔවුන්ගේ තර්ක සහ ප්‍රශ්න එලෙසම බාර නොගෙන ශු.බයිබලය හදාරමින් සහ පරිශීලනය කරමින් ශුද්ධවූ සභා සම්ප්‍රදාය ගැනද නිසි අවබෝධයක් ලබා ගැනීමයි.

අවසාන වශයෙන් කිතුනුවන් සහ රෝමානු කතෝලිකයන් වශයෙන් අප අවබෝධ කර ගත යුත්තේ බයිබලය පුරාම කථා කරනුයේ ක්‍රිස්තුන් වහන්සේ ගැනය. කවරකු සම්බන්ධව නව ගිවිසුම පැවසුවත් ඒ සෑම චරිතයක්ම ක්‍රිස්තුස් වහන්සේට කේන්ද්‍රීය කර සඳහන් කිරීම එහි විශේෂත්වයයි. විශේෂාකාරයෙන් මරිය තුමියගේ කන්‍යාභාවය බයිබලය සඳහන් නොකරයි. එනමුත් ජේසුස් වහන්සේගේ උපත කන්‍යාවකගෙන් සිදුවූ අයුරු එහි සඳහන් කරයි. එලෙස සඳහන් කරන්නේ මරිය තුමියව පසසන්නට නොව ජේසුස් වහන්සේගේ උපත මනුෂ්‍ය මැදිහත්වීමකින් තොරව සිදු වූ වග පවසන්නටය. මරියාවන්ගේ කුස තුළ ජේසුස් වහන්සේ පිළිසිඳ ගැනීම ශුද්ධාත්ම බලයෙන් සිදු වූවා යන්න පෙන්වාදීමටය.

මරිය තුමියගේ සදාකාලික කන්‍යාභාවය පිළිබඳ තවදුරටත් අපව දැනුවත් කරන්නේ ශුද්ධ වූ සභා සම්ප්‍රදාය ය. දේව අනාවරණය දේව වචනය මෙන්ම ශුද්ධ වූ සභා සම්ප්‍රදාය තුළින්ද අපට ලැබෙන බව අපගේ විශ්වාසයයි.


වසර 2000 ට පමණ ඈතට විහිදෙන සභා සම්ප්‍රදාය කතෝලිකයන්ට උරුම වී ඇත. මූලධර්මවාදීන්ට එවැනි සභා සම්ප්‍රදායක් නොමැති අතර ඔවුන්ගේ සියලු දේව අනාවරණවල පදනම බයිබලයේ වචනයට පමණක් සීමා වී ඇත. මරියාවෝ ජේසුස් වහන්සේගේ උපතට පෙර පසු "සදාකාලික කන්‍යාවකි" යන්න කතෝලික සභාවේ සම්ප්‍රදායයි, ඉගැන්වීමයි, විශ්වාසයයි (ක.ස.ධ. 499). ජොහාන් සුවිශේෂක වරයා ක්‍රිස්තුන් වහන්සේ කළ කී දෑ සියල්ල සුවිශේෂවල සටහන් නොකළ බව පවසයි. ඒ සියල්ල සටහන් කරන්නට ගියොත් ඒ ලියවෙන පොත්වලට ලෝකයේ ඉඩ මදි වන බව ද ප්‍රකාශ කරයි (20:30-31 සහ 20:25). අපගේ ඇදහිල්ල වර්ධනය කරන්නට සහ ජීවනය ලබා ගන්නට එය අත්වැලක් ලෙස සටහන් කර ඇති තොරතුරු වැදගත්ය යන්න ජොහාන් සුවිශේෂකවරයා පවසයි. ශුද්ධ වූ සම්ප්‍රදාය තුළින් අපගේ ඇදැහිල්ල වර්ධනය කර ගන්නට ලැබෙන අවබෝධය ඉතා විශේෂය. ජේසුස් වහන්සේගේ සහෝදර සහෝදරියන් යයි සුවිශේෂකවරුන් සඳහන් කරන්නේ එක කුසේ උපත ලැබූ සහෝදර සහෝදරියන් නොව ක්‍රිස්තුන් වහන්සේගේ සමීප ඥාතින්ටය. එබැවින් මරියතුමියට ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ හැර වෙනත් දරු දැරියන් නොසිටි බව සභා සම්ප්‍රදාය ද ඉඳුරාම ප්‍රකාශ කරයි.

**ගරු ඇල්වින් පීටර් ප්‍රනාන්දු පියතුමා**

මීසම් සේවක, අම්පිටිය දෙව්මැඳුර

කථිකාචාර්ය

ජාතික දෙව්සත්හල, අම්පිටිය



# ඕං එහෙනං



පුංචි කාලෙ අපි අහපු කතන්දර අතරින් අන්දරෙ විශේෂිතයි
අන්දරෙ කියාපු කතා අතරෙනුත් සීනි කාපු හැටි හරිම රසයි
උඹේ කටෙත් පස් මගේ කටෙත් පස් කෑවේ රජ ගෙයි සීනි තමයි
ඒකෙන් පාඩුව රජ්ජුරුවන්ටයි හිනහවෙවී තව තර වුණා නොවැයි

බද්ද බහිනකොට සීනි ගෙනාවා අන්දරේලගේ කරල් පැහෙයි
ගබඩා පිරුණා සතුට ඉතිරුණා කෝටි ගණන් රජයට පාඩුයි
බදු වැඩිවෙනකොට බදු අඩු වෙනකොට ලාබයි පාඩුයි දෙකම එකයි
රජයේ ලොකු මැති ඇමැත්තො කියන්නෙ කටින්ද කියලා හිතට සැකයි

අපේ රටට මොන හෙණයක් ගහලද පුවත් බලනකොට සිතට බයයි
පිළිකාකාරක පොල්තෙල් ගෙනල්ල පොල්තෙල් ලාබෙට රටට බෙදයි
බල්ලො මරල හරි සල්ලි හොයනවා කියාපු කතාව දැන් පරණයි
මිනී මරල හරි සල්ලි හොයන්නට මහ මොළකාරයො පේලි ගැසෙයි

සිංහරාජෙටත් මුතුරාජවෙලටත් කොම්පැනි බහිරයො බැල්ම හෙළයි
පොළෝ පෙරළලා ඩෝසර් කරලා ඇළ දොළ ගංගා හරස් කරයි
හරිත වියන් නැත අලි මංකඩවල් නැත රංචු පිටින් අලි ගමට වදියි
මේ ගැන කියන්න හඬ නැගූ භාග්‍යාට එලව එලව තර්ජන කරතෙයි

මේ මැයි මාසේ මරි මව් මාසේ පුංචි සන්දියට අපෙ හිත දිව යයි
මරි මව් සුරුවම මලින් සරසලා පවුලේ සැම හවසට රැස් වෙයි
ගීත ගයාලා යැදුම් පුදාලා මරි මව් සරණය පතා යදියි
පවුලේ හැමෝම එකට එකතු වුණ දැහැමි කාලෙ අදටත් මතකයි

එදා එහෙම වූ සුන්දර කාලය වත්මන් පවුලට අහිමි වුණෙයි
රූප පෙට්ටියේ යකා නටනකොට පවුලම ආවේසයෙන් නටයි
මල් වැස්සේ අපි තෙමි තෙමි ඉඳගෙන "ෆන්" එක ගන්නව ඇඟට ගුණයි
සුනාමි ඇවිදින් කඳු වැටි පෙරළී ඉඩෝරයට මැරෙනව සිකුරුයි

සූරිය මාමා - ජෝසප් ඩයස්





නමෝ මරියනී... 15 වන පිටුවෙන්.....

වඩා දුර්දාන්ත බොනපාට් පාලනයක් ලැබීමය. ඉන්පසු විශ්වාසයේ පුනරුදය නැවත ඇරඹී අතර ප්‍රංශය ඉදිරියට ආවේ විදුලි වේගයෙනි. දෙවන ලෝක සංග්‍රාමයේදී වත් පැරිස් නගරයට විනාශය අත්පත් නොවුණේ නොත්‍රදාම් පල්ලියට තිබූ මහා ලැදියාවත්, මරිය බැතියත්, බව ජර්මානු සෙන්පතියකු දෙවන ලෝක යුද්ධය අවසානයේ ප්‍රකාශ කර ඇත.

එහෙත් ගැටලුව වන්නේ, මහා කෲර ආක්‍රමනිකයාගෙන් ගැලවුණු, අවුරුදු දහස ඉක්මවූ නොත්‍රදාම් දෙව්මැදුර ගිනිබත් වීමත්, අප කතෝලික දින දර්ශනයේ උතුම්ම දින, මහා දවාලක, ප්‍රසිද්ධියේ වූ සිය ගණනක මනුෂ්‍ය ඝාතනය පිටුපස ඉන්නා බලවේග හරියටම හඳුනා ගැනීමයි. දේවමාතා බැතිය ඉතා තදින් පිළිපැදිය යුතු වන්නේ අප ශිෂ්ටාචාරයට අතීතයේ මෙන් අදද එල්ලවන පීඩනවලට මනුෂ්‍ය මට්ටමට එහා ගිය දේවබලයක් අවශ්‍ය නිසාය. අපගේ සම්පත්, පිරිස අප රටේ අල්ප වුවත් එදා කොරින්තියේදී අපට පෙන්වූ දේවමාතා මැදහත්කම සිහිකරමු. අචල දේව විශ්වාසී නැඹුරුවකට හුරු වෙමු.

උක්ත මා සඳහන් කළ ඓතිහාසික හා පෞද්ගලික දේව මාතා භක්තියෙහි වූ අධ්‍යාත්මික හා අප වත්මනේ ජීවත්වන ශිෂ්ටාචාරයට වූ බලපෑම මෙතෙකැයි කියා කිවනොහැකිය. සියලු වසංගත හා යුද්ධ ඒමට පෙර ඉන් මිදීමටත්, ඒවායේ තීව්‍රතා මර්දනය කිරීමටත් දේවමාතාවන් නොයෙක් වර ගෝලීයව ස්ථානගත වෙමින්, දර්ශනය වෙමින් අප අධ්‍යාත්මය ඒකාලෝක කිරීමට නිරන්තර උත්සාහ කරයි.

අපද එදා කල්වාරියෙන් දේවමාතාවන් අපගේ මාතාවන් ලෙස ජේසු සමිඳාණන් බාරකළ මොහොත මෙනෙහිකර, පෞද්ගලිකවත්, ජාතියක් හා කිතුනු ලෝ පුරවැසියන් ලෙසත් දේවමාතා සරණ හා මගපෙන්වීම අපේක්ෂා කරමු.

## මගේ ආදර දේව අම්මේ

මගේ ශ්‍රම ශක්තිය හා දහදියද, නෙතේ රැඳෙන කඳුළු බිඳු හා
හදවතේ නැගෙන සෝ සුසුම් සමගින්
සතුට, සැනසුම, සුවය ආදි
මේ සියලු දේ
බාර කරමි ඔබේ දෝතට මගේ ආදර දේව අම්මේ.....
නිබඳ මගේ දිවි ගමනේ ඔබම සරණය වන නිසා.....

එම්. පද්මලතා ඔබ්‍රිස්
මැද නයිනමඩම

## ශක්ති ප්‍රබෝධනය ඉදිරි තේමාවන්

**2021 ජූනි මාසය - "මිහිතලයට පිහිතලය නොතබන්න"**
ජූනි කලාපය සඳහා ඔබ එවන ලිපි අප්‍රේල් 30 ට පෙර අප වෙත එවන්න.)

**2021 ජූලි මාසය - "තිළිණයකි ජීවිතේ"**
ජූලි කලාපය සඳහා ඔබ එවන ලිපි මැයි 31 ට පෙර අප වෙත එවන්න.)

# පුංචි විකුම්

## ළමා ප්‍රබෝධනය





## කුරුලු කූඩුව

සොනාලි 5 වසරේ ඉගෙනුම ලබන සිසුවියකි. ඇය පරිසරයට ආදරය කරන සහ පරිසරය සමග නිතර ගැවසෙන දැරියකි. කූඹි ගමන් ගන්නා ආකාරය පියාඹන සමනලයින් පසුපස දුවමින් තොරතුරු රැස් කරන කුරුල්ලන්ගේ හඬට සවන්දීමට කැමති ඇය නිතරම ගැවසෙන්නේ පරිසරය සමගය.

එක දවසක් ඇගේ නිවස ඉදිරිපිට තිබූ මල් පඳුරක කුරුලු කූඩුවක් සාදා තිබෙනවා ඇය දුටුවාය. නිතර නිතර ඒ ගැන සොයා බලන ඇයට දිනක් එහි කුරුලු බිත්තර තුනක් තිබෙනු දක්නට ලැබුණි. ඒ ගැන සතුටට පත් සොනාලි වහා දිවගියේ අම්මා වෙතටය. එය අම්මාට සැල කළේ ඉමහත් ප්‍රීතියෙනි. ඇය උඩපැන්නාය. නැටුවාය. ගී ගයමින් සතුටු වුණාය. මෙසේ සෝදිසියෙන් සිටින සොනාලිට දිනක් දක්නට ලැබුණේ කුරුලු කූඩුවේ පුංචි පැටවුන් තුන්දෙනෙක් කටවල් ඇරගෙන කිචිබිචි ගාමින් සිටින බවය. ඒ දුටු සොනාලිට ඉහේ මලක් පිපුණා වැනි විය. නිතර ඒ දෙස බලාසිටින ඇය දුටුවේ කුරුලු අම්මයි තාත්තයි පැටවුන්ට කෑම කවන ආකාරය ය. අම්මයි තාත්තයි කූඩුවට ළංවෙනකොටම පැටවුන් කෑගසමින් කටවල් අරිනු දුටු සොනාලි ද කුරුලු ජෝඩුව කෑම කවා ගිය පසු කළේ කෙසෙල්, කොමඩු වැනි පලතුරු කෑලි උන්ගේ කටවලට දැමීමය. පැටවු ද සතුටින් ඒවා ආහාරයට ගත්හ.

කුරුලු පැටවුන්ගේ ආරක්ෂාව ගැන සිතූ සොනාලි ලොකු රෙද්දක් ගෙනැවිත් මුළු ගසම වැසී යන සේ ගස වැසුවාය. එය දුටු සොනාලිගෙ අක්කා ඇයට කීවේ "ඇයි නංගියේ ඔහොම ගහ වහපුවම උන්ට කෑම ගෙනත් දෙන්නේ කොහොමද" කියලා ය. එය තේරුම්ගත් සොනාලි රෙදි කැබැල්ල ඉවත් කළාය.

කුරුලු පැටවු දින දින වැඩෙන්නට වූහ. දිනක් සොනාලි කූඩුව අසලට එන විට පැටවුන් දෙදෙනකු බිම වැටී බොහොම අමාරුවෙන් පියාඹන්නට උත්සාහ කරනු ඇය දුටුවාය. විගස ඔවුන් දෙදෙනා අල්ලාගෙන කූඩුවේ තැබූ ඇය නිතර කල්පනා කළේ ඔවුන්ගේ ආරක්ෂාව ගැනය.

දින සති කෙමෙන් ගෙවෙන්නට විය. කුරුලු පැටවුන් සොනාලිටත් හොරෙන් පියඹා ගොස් තිබිණි. ඇයට දුක හිතුණද ඇගේ අම්මා සොනාලිට කීවේ "දුව ඔය ගැන දුක්වෙන්න එපා. සත්ත්ව ලෝකයේ සොබාවය එහෙම තමයි. දුවත් කවදා හරි ලොකු මහත් වෙලා හොඳට ඉගෙනගෙන සමාජය නමැති ලෝකයට ඉගිලෙන එක කාටවත් නවත්වන්නට බැරි බවය."

ආදර දුවේ පුතේ, අපිත් සොනාලි වගේ ගහට කොළට සතා සිව්පාවට ඇළ දොළ ගංගා වලට ආදරේ කරන, පරිසර හිතකාමීන් වෙන්න උත්සාහ කරමු. එතකොට භාග්‍යා අක්කාට වගේ නොයෙකුත් අත්දැකීම්වලට මුහුණ දෙන්න සිදුවේවි. මොන බාධක ආවත් පරිසරය සුරකින්න බිය නොවන්න. තව කෙනකුව දැනුවත් කරන්න.

සූරිය මාමාට මේ ටික කීවේ සූරිය මාමාගේ පුංචි මිනිබිරියක් වන භාවියා දුවය.

**සූරිය මාමා**







## චාරිකා වන්දනාව

මාර්තු මස පෝය දවසෙ
ගියා අපේ වන්දනාව
කල්වාරිය මග්ගොන ඇති
බොහොම දුරයි ගමන සැපයි

පුංචි යැදුමකින් සැරසුන
ලා අරුණාලු සමඟ බැඳුණ
හීන් ගීතිකා හඬකින්
බස් රථයේ ගමන ඇරඹී

පාන් බනිස් පැටිස් රෝල්ස්
අලුවා වැලිතලප සමග
කඩල මුරුක්කු ද කෑවා
චාරිකය අමතක කර

බැතිමත් සිත පෙරට දමා
කල්වාරිය නම් නැංගා
දේශනාව හොඳම හොඳයි
ඇතුළු හදවතට වැදුණා

දහම් සෙවණේ පහස ලබා
දවාලෙ බත් එක කෑවා
වාසනාව තිබුණෝතිං
කවදාහරි මං එනවා

ආපසු ගෙදරට එනකොට
හොඳටම කළුවර වැටිලා
ඉදිකඩ ළඟ මග බලාන
අම්මා තනියම හිටියා

**මාක් ජයමාන්න**
11 ශ්‍රේණිය
සාන්ත ආනා විදුහල, කුරුණෑගල

# ධර්මදානයේ මාතාවන් වන මරියෝත්තමාවෝ



තම පුතණුවන්ගේ මරණය නැතහොත් කුරුස පත් වීමෙන් පසු ශ්‍රාවකයන් සමග සේනාකුලුවෙහි දොරගුලු ලාගෙන සිටින විට ශුද්ධ වූ ආත්මයාණන් වහන්සේ ගිනිදිව් ලෙස දේව මාතාවන්ගේ සහ සෙසු ශ්‍රාවක පිරිසගේ හිස් මුදුන් හි පිහිටුවා ඔවුන්ට කිසිදු චකිතයකින් තොරව දේව රාජ්‍යය පතළ කිරීමට හැකියාව දුන් සේක. මෙම අවස්ථාවේ ගෝලයින්ට නායකත්වයක් දෙමින් බිය නොවී යාච්ඤාව තුළ ජීවිතය ගොඩනගා ගැනීමට කන්‍යා මරිය වහන්සේ මහත් පිටිවහලක් විය. පාවුලු තුමා කොරෙන්තිවරුන්ට ලියන ලද ලිපියෙහි සඳහන් වනුයේ අපගේ ශරීර ශුද්ධාත්මයාණන්ගේ මන්දිර ලෙසය (කොරින්ති 6:18-19). අප තුළ වැඩ වසන ශුද්ධාත්මයාණන් මෙන්ම කන්‍යා මරිය වහන්සේ ද අප මධ්‍යයේද වැඩ සිටිමින් අපගේ ජීවිත සුක්කානම මෙහෙය වන්නේ සදාතන ස්වර්ගීය සැපත ලබාදීමේ අරමුණෙනි. ශුද්ධවූ සභාව තුළ ධර්මදානයේ යෙදෙන, ශුද්ධ වූ සභාවට මාතෘක සෙනෙහස දක්වන එකම මව්තුමිය කන්‍යා මරියාවෝය. එතුමියගෙන් තොරව ධර්මදානයේ ස්ප්‍රිතුව සැබෑ ලෙසම මනුෂ්‍ය සංහතියට අවබෝධ කර ගැනීමට අපහසුය. එසේනම් මරිය වහන්සේ සුවිශේෂ ග්‍රන්ථ නොලිව්වාට එතුමිය ධර්මදූතිකාවක් නොවේ යැයි කිව නොහැක. එසේනම් අපගේ සැබෑ ආදරයට නතුවිය යුත්තේ අති උත්තුංග වූ කන්‍යා මරියාවන්මය.

ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසපත් වීමේදී සහ උන්වහන්සේ කුරුසිය මත ලෝකය තුළ හිස ඔසවන්නාවූ පාපයේ ආදීනව සහ දේව කරුණාව එක විටම තමන්ගේ මාංසය තුළ දරාගන්නා විට තම ප්‍රේමණීය මෑණියන් හා තම ප්‍රේමවන්ත ගෝලයාව උන්වහන්සේගේ නෙත ගැටුනු විට සමිඳාණන්ට යම් අස්වැසිල්ලක් දැනෙන්නට ඇත. මෙම මොහොතේදී පියාණන්වහන්සේ තමන් හට භාර කළාවූ අති උත්තුංගම කාර්යය නිමා කිරීමට මත්තෙන් ජේසුස් වහන්සේ තම ප්‍රේම කළ ශ්‍රාවකයාට කතා කරමින්, "පුත්‍රය මෙන්න නුඹේ මෑණියෝ" මරියතුමියට කතා කරමින් "ස්ත්‍රිය මෙන්න නුඹේ පුත්‍රයා" (ජොහාන් 19:26-27) කියමින් තමන්ට භාරවූ කාර්යය නවතමින් එම භාරදූර කාර්යය තම මෑණියන් හට පවරමින් උන්වහන්සේ අවසාන හුස්ම පොද ගොල්ගොතාව මතදී දේව තාත්තාට ඔප්පු කළ සේක. මෙම වදන් වලින් ප්‍රධාන කොට කියැවෙන තමන්ගේ මව වෙත තිබූ භක්තිය සහ සැලකිල්ලට එහා ගිය ගැඹුරු අර්ථ දැක්වීමක් ඇත.

එම වදන් විශේෂ ගැලවීමේ කාර්යයේ අභිරහස ප්‍රකාශ කරන අනාවරණමය සහ නිශ්චිත වදන් පෙළකි. කුරුස පාමුල නව මැවිල්ලේ උතුම්ම හෝරාවේ ක්‍රිස්තුස් වහන්සේ අපව මරියෝත්තමාවන් වෙත යොමුකළ සේක. අපව මරිය වහන්සේ වෙත යොමු කළේ අපට එතුමියගේ මැදිහත්කම අති විශේෂ නිසාය.

දෙව් මව්න් වයස අවුරුදු දහසයක් නැමති කාලයකදි ශුද්ධාත්මයාණන් දුන් පණිවුඩය දරා ගනිමින් දේව කැමැත්තට හිස නැමුවාය. අප දේව අභිමතයට ඉඩ දෙනවාද? කල්වාරිය මත තම පුත්‍රයා කුරුසියේ දැත් දෙපා දෙදිගට අදින විට දේව මාතාවන්ට දැනුණු වේදනාව සේම වේදනාවක් ඔබ මා





එතුමිය හැර යන විට එතුමියට දැනෙන බව මතක තබා ගත යුතුය. දෙව් මවුන් ශුද්ධ වූ සභාව පවුලේ සියලුම පවුල් සාමාජිකයන්ව තම ශුද්ධ වූ සළු සෙවණට ගෙන රක්නා බව ස්ථිරය. ඔබ මම ධර්මදානයක යෙදිය යුතු කාලයක ඔබ මම ධර්මදානයට එරෙහිව සමාජය තුළ ක්‍රියා කරන්නන් නොවේද? තමන්ගේ පවුලේ සිටින මවට වේදනා දීම මහත් ශෝක ජනක තත්ත්වයකි. අප මතක තබා ගත යුතු වන්නේ, දෙව් මවුන්ගේ සුරතේ එල්ලී ස්වර්ගීය භෝජනය රස විඳීමට අපට මගක් ඇති බවයි. එසේ නම් අපිත් ධර්මදානයේ ජීවිත ආදර්ශය තුළ දෙව් මවුන් තුළ මෙන් ජීවිත ආදර්ශයෙන් දිවි ගෙවමු. ජපමාලය නැමැති ශුද්ධවූ යැදුම තුළින් ස්වර්ගීය සැපත භුක්ති විඳිමු. මනස්තාපයකින් යුතුව ජීවිතය ශක්තිමත් කර ගැනීමටත්, ධර්මදානයේ මරියාවන් මෙන් අපත් ධර්මදානයේ යෙදී ඔබට මට පැවරී ඇති දිවැසිවර කාර්යය ඉටු කිරීමට වෙර දරමු.

**බුද්ධික සඳරුවන්**
ශා. මරියා මහ විදුහල, මීගමුව
පශ්චාත් සා. පෙ.

## සිරි ලක් විලේ

සිරි ලක් විලේ උපන් නිමල නෙළුම් කුසුමියේ
බැඳා ජය දද කරවි පා ඔබ සෙනෙහෙබර වූ කොමලියේ
රකිව් දරු කැල දමා සෙවණේ සළුවේ ඔබගේ කුමරියේ
ගයව් තුති ගී දමා මල් වැල් දෙරණේ අප මව් රැජිණියේ


රුදුරු යුද මකරාගේ බැල්මෙන් රැක්කේ අප පෙම් මව්වනේ
රෝ බියන් දුරලා රකින් අප දයාබරිත වූ මව්වනේ
ස්වර්ගේ හැරලා ලෝ තලේ ඉඳ සුරකිනා අප මව්වනේ
දෙව් රජුන් හමුවේ කියා අප ගැන යදින් මා මව්වනේ

දෙව් පුතුන් රන් කුසින් බිහිකර අපට දුන් දෙව් කුමරියේ
මෙමා සමිඳුගේ දාසිමී යැයි කියා නිහඬවූ කුමරියේ
අසිපතින් හද මඬල සිදුරුවූ දා කඳුළු සැළූ කුමරියේ
දෙන් වරම් අප හට සිනාසෙනු ලෝක බාධක ඉදිරියේ

කිරුළු ලෝ ඔබ දමා හිස මත වඳිම් ආදර රැජිනියේ
සඳ මඬල ඔබ දෙපාදෙහි ලා ගී ගයව් අප රැජිනියේ
දොඩව් පෙම් බස් කොඳුරමින් සිරි හදට ඔබගේ රැජිනියේ
කියව් ගී පද ගොතා පෙම ගැන ඔබේ ආදර රැජිනියේ

**ශෙවෝන් පෙරේරා**
13 ශ්‍රේණිය
ශාන්ත පීතර විද්‍යාලය,
කොළඹ 04

## ප්‍රහේලිකා අංක - 63



**හරහට**

1. බීරුට් හි පසුගියදා ඇති වූ පිපිරුමට හේතු වූ රසායන වායුව.
4. ජලය පවතින එක් අවස්ථාවකි.
9. ගුණදාස අමරසේකරයන්ගේ නවකතාවකි.
11. පාර්ලිමේන්තුවේ භාවිත වන නියෝග විශේෂයකි.
13. කොරින්ති සංඝය තුළ දේව වචනය ප්‍රකාශ කළ අයෙකි.
15. "හොඳට ............ දෙකට කටමය"
16. සපත්තු වලට තවත් නමකි.
18. පර්සියන් රජු අහස්වේරෝෂ්ගේ ප්‍රථම බිරිඳ (එස්තර් පොත)
22. ප්‍රමාණය යන්නට සම අරුත් දේ.
23. පසුගිය ඔක්තෝබර් 10 වන දින ශුද්ධවරයට ඔසවන ලද මෑතකාලයේ ශුද්ධවන්තයා.

**පහළට**

1. සාක් සංවිධානයට අන්තිමට එකතු වූ රට.
2. ශරීරයේ කොටසකි
3. සුළඟට සමාන අරුත් දේ.
5. අලංකාර යන්නට සමාන වචනයකි.
6. සිංහල ක්‍රමයට අනුව අවුරුද්දේ මාසයකි.
7. "මිනිස්" යන්නට සම අරුත් දේ.
8. ශ්‍රී ලංකාවේ පවතින සංගීත කණ්ඩායමකි.
10. මිහිකත යනු.
12. මූලික ගිණුම්කරණයට අනුව හිමිකම් වගකීම් සමාන වන්නේ.
14. "හම" යන්නට සමාන අරුතකි.
17. ජනතාවගේ සිත.
19. ශු. පාවුලු තුමා විසින් ලිපි ලියන ලද්දේ.
20. බංග්ලාදේශයේ අගනුවර.
21. මිතුරාට තවත් වචනයකි.

සැකසුම :

**ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා**

මීසම් සේවක, ඇඹිලිපිටිය.

ඔබගේ පිළිතුර තැපැල්පතක පමණක් ලියා පහත ලිපිනයට, 2021 මැයි 31 ට පෙර තැපැල් කරන්න.

ජයග්‍රාහකයන් අතුරින් තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙලින්, රු.1000.00, රු. 750.00, රු. 500.00** බැගින් පිරිනැමේ.

**විශේෂ මතක් කිරීමක්** - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.

**ප්‍රහේලිකා අංක - 63**
**"ළමා ප්‍රබෝධනය",**
**අංක 265, ඩීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**





## ප්‍රහේලිකා අංක 61

- ප්‍රහේලිකා අංක 61 ට ලැබුණු පිළිතුරුවලින් නිවැරදිව පිළිතුරු දුන් කිසිවෙක් නැත.



## ප්‍රහේලිකා අංක 61 - පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 ඉ | ප | නැ | ල් | ල | | | | 2 පෙ | 3 සෝ |
| ව | | | | | 4 ව | න් | 5 නි | | මා |
| | 6 වි | ය | 7 ත් | ම | ග | | 8 ය | ල | |
| 9 රා | ධා | | ව | | කී | | ග | | 10 මො |
| | ය | | ර | | ම් | | ලා | | ණ |
| | 11 ක | ර් | ණ | ය | | 12 පා | | | රා |
| 13 ජෙ | | | ය | | 14 ව | ර් | ණ | | ග |
| 15 කො | ළ | ඹ | | 16 පු | | ව | | 17 නා | ල |
| නි | | | 18 සු | දු | | තී | | වි | |
| 19 යා | ම | යැ | දු | ම | | | 20 ල | ක | ර |

## මරි මච්නි

රෝස කුසුම් බර වෙන තැන සුවඳ හමනවා
නීල ජලය බැස යන තැන සිසිල දැනෙනවා
කුරුලු රංචු එක් වන තැන ගීත ඇසෙනවා
දේව අම්ම වඩිනා තැන සතුට රැඳෙනවා

ඔබ ශ්‍රී වත දකිනා සැම දෙන වසඟ වනා
රෑ අහසේ බබළන තරු ඔබෙ නෙත් වැන්නා
දෙඅතෙන් විහිදෙන රැස් ලෝකෙටම සෙත වනා
බැහැපත්කම වැනි ගුණ බොහො ඔබෙ හදේ වනා

ජන්ම දොසෙන් නිදොස් දියණි ඔබයි මැණියේ
සියලු දුකට අසරණයට සරණ ඔබ අනේ
එන එන හැම දුකට මගේ ඔබ පිළිසරණේ
දේව පුතුන් ඉදිරියෙ අප නිසා යදින්නේ

සියලු සතට සතුට බෙදන ඔබ අපෙ අම්මා
ජපමාලයෙ බලය පාන ඔබ දෙව් අම්මා
මල් ගොමු පිරි තැනට වඩින පෙම්බර අම්මා
මගේ දුකට සතුට දුන්න ආදර අම්මා

**වින්දන සාවින්ද**
10 ශ්‍රේණිය
සා. චාල්ස් දහම් පාසල, මොරටුව

## කතෝලික ධර්මය
## අ. පො. ස. (සා/පෙළ) විභාගය - 2021
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - II කොටස

**සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**1)** 1. ශුද්ධවූ බයිබලයේ ප්‍රධාන කර්තෘ සහ උප කර්තෘ නම් කරන්න.
2. කතෝලික ධර්මයේ පදනම කුමක්ද?
3. ශු. ලූක් තුමා තම ග්‍රන්ථය පිළිගැන්වූයේ කාටද?
4. ද්විතීය පාවුලු සන්දේශ දෙක නම් කරන්න.
5. පැරණි ගිවිසුම තුළ ප්‍රඥාව සඳහා යෙදන හෙබ්‍රෙව් වචනය හා එහි අර්ථය සඳහන් කරන්න.
6. පංච පුස්තකය සකස්වී ඇත්තේ කුමක් පදනම් කරගෙනද?
7. ශුද්ධ වූ බයිබලයේ හීබෘ පිටපත බිහි වුයේ කුමන මූලාශ්‍රය මගින් ද?
8. දේශක දිවැසිවරුන්ගේ වචන හා ක්‍රියා ඇතුළත් පුරාණ ගිවිසුමේ ග්‍රන්ථ දෙකක් නම් කරන්න.
9. යෙසායා දිවැසිවරයා තම කැඳවීමට පිළිතුරු දුන්නේ කෙසේද?
10. ශුද්ධ වූ ජොහාන් තුමාගේ මව හා පියා කවුද?

**2)** 1. පංච පුස්තකය සඳහා යෙදෙන හෙබ්‍රෙව් නාමය කුමක්ද?
2. පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් තුනක් ලියන්න.
3. පංච පුස්තකය තුළ අඩංගු වී ඇති කරුණු පහක් ලියන්න.

**3)** 1 ඉශ්රායෙල් දිවැසිවරුන් බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
2. දේශක දිවැසිවරුන්ගේ ලක්ෂණ තුනක් ලියන්න.
3. කිතුනු දරුවකු ලෙස ඔබත් සමාජයට දිවැසිවරයකු වන්නේ කෙසේද කියා කරුණු පහෙන් විස්තර කරන්න.

**4)** 1. අභිධාර්මික ප්‍රඥාව සඳහා පුරාණ ගිවිසුමේ ලියා ඇති ග්‍රන්ථ දෙකක් නම් කරන්න.
2. පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍යය ඉදිරිපත් කර ඇති සාහිත්‍යමය ස්වරූපයන් තුනක් ලියන්න.
3. ඔබේ ජීවිතයේ ප්‍රඥාවන්තව කටයුතු කළ හැකි අවස්ථා පහක් ලියන්න.

**5)** 1. ක්‍රියා පොත රචනා වී ඇත්තේ කුමන ස්ථානයේද කිනම් කාලයකදී ද?
2. ශු. ලූක් තුමා රචනා කරන ලද ග්‍රන්ථ දෙකක් නම් කරන්න.
3. ලූක් තුමා පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.





## පිළිතුරු

**1)** 1. ප්‍රධාන කර්තෘ - දෙවියන් වහන්සේ උප කර්තෘ - මිනිසා.
2. දේව වචනය
3. ශ්‍රීමත් තියෝපිලස් තුමන්ට.
4. එපීස, කොලොස්සි
5. හොක්මා - සාර්ථකව හා ධාර්මිකව ජීවත් වීමේ හැකියාව.
6. පරම්පරාගත විශ්වාස හා අත්දැකීම් මත.
7. ජුදා මූලාශ්‍රයෙනි.
8. 1,2 සාමුවෙල් 1,2 රජාවලිය
9. "මෙන්න මම මෙහිය. මා යැව්ව මැනව."
10. සෙබදී හා සලෝමි.

**2)** 1. ටෝරා
2. නීතිය, ව්‍යවස්ථාවලිය, මෝසස් තුමාගේ ව්‍යවස්ථාව.
3. • මිනිසා මවනු ලැබීම හා පාපයට වැටීම. • විශ්වයේ ආරම්භය.
• දෙවියන් වහන්සේ ආදි පීතෘවරුන් තෝරා පත්කර ගැනීම.
• ඉශ්රායෙල්වරු ඊජිප්තුවේ වහලුන් බවට පත්වීම.
• මෝසෙස් තුමාගේ නායකත්වය යටතේ ඉශ්රායෙල් ජනතාව පොරොන්දු දේශයට යාම.

**3)** 1. දේශන දිවැසිවරුන් හා ලේඛක දිවැසිවරුන්.
2. • ධ්‍යානයට සමවැදීම. • කණ්ඩායම් වශයෙන් මෙහෙවරෙහි යෙදීම.
• තම දූත මෙහෙවර සනාථ කිරීම සඳහා හාස්කම් කිරීම.
3. සිසු අදහස්.

**4)** 1. ජෝබ් සහ ධර්මදේශකයා.
2. ප්‍රස්තාව පිරුළු, උපදේශ, කතාන්දර, සංකල්පනා, ගීත.
3. සිසු අදහස්.

**5)** 1. ග්‍රීසියේ "අක්කායා" හිදී ක්‍රි.ව 80-90 අතර කාලයේදී.
2. ලුක් සුබාරංචිය හා ක්‍රියා පොත.
3. ඉතිහාසඥයෙකි, චිත්‍ර ශිල්පියෙකි, වෛද්‍යවරයෙකි. පාවුලු තුමාගේ දෙවන හා තෙවන චාරිකාවලට සම්බන්ධ වී ඇත.

**ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය.**
ආචාරිනී - මිනු/ ශ්‍රී ඥානෝදය ම.ම.වි. - දිවුලපිටිය.

## විශ්ව සභා ඉතිහාසය (III)

**අ. පො. ස. (උ.පෙ.) ක්‍රිස්තියානි ධර්මය / ශිෂ්ටාචාරය සඳහා අත්වැලකි.**

මුල් අපෝස්තලික සමය (4 වන සියවස අවසානය දක්වා)

### අධිරාජ්‍යය පුරා සුබාරංචිය ව්‍යාප්තවීම

රෝමානු අධිරාජ්‍යයේ හැම ප්‍රදේශයක්ම ආවරණය කරමින් සුබාරංචිය ව්‍යාප්ත වීම ඉතා ශීඝ්‍රයෙන් සිදුවිය. ඒ සඳහා විශේෂ දායකත්වයක් දක්වන ලද්දේ ශු. පාවුලු තුමාය. එතුමාගේ දේශනා, ඉගැන්වීම්, යැවුම් පත්‍ර එම කටයුතු සඳහා උපකාරී විය. පාවුලු තුමාගේ චින්තනයට අනුව ලියා ඇති ඒ ලිපිවලින් පෙන්වා දෙන්නේ ක්‍රිස්තුස් වහන්සේ අදහා ගැනීමෙන් මනුෂ්‍යයා පාපය නැමති බැම්මෙන් මිදෙන බවය. පාවුලු චින්තනයට අනුව ක්‍රිස්තු ඉගැන්වීම් තුළ කුලය, භාෂාව, ලිංගභේදය, ජනවර්ගය නොසලකා ඇති බව පෙන්වා දේ. ඒ හේතුව මුල් කරගෙන අධිරාජ්‍යය පුරා ධර්මය ප්‍රචාරය වීමේ පසුබිම සකස් විය. එසේම තවත් හේතු කිහිපයකි. එනම් අධිරාජ්‍යයේ දේශපාලන එක්සත් භාවය, රෝම සාමය, අධිරාජ්‍යය පුරා විහිදී ඇති මාර්ග පද්ධතිය, ග්‍රීක භාෂාව ඒ සඳහා මුල් විය. රෝමවරුන් දේශපාලන වශයෙන් ජයගෙන තිබුණි. එහෙත් සංස්කෘතික වශයෙන් ග්‍රීක සංස්කෘතියට බර වී කටයුතු කර ඇත.

### ක්‍රිස්තියානිය ස්වාධීන සභාවක් බවට පත්වීම

එලෙස ජුදා දහමේ අංකුරයක් ලෙස බිහිවී අධිරාජ්‍යය පුරා ව්‍යාප්ත වූ ක්‍රිස්තු ශාසනය තුළින්, කල් ගත වීමත් සමඟ නව ගිවිසුම සම්පාදනය වීම ඇරඹුණි. ග්‍රීක බසින් රචනා වූ නව ගිවිසුම සුබාරංචි ග්‍රන්ථ, පාවුලු තුමාගේ හසුන්පත්, ක්‍රිස්තුස් වහන්සේගේ අපෝස්තුලුවරුන් විසින් ලියන ලද හසුන් උදා - ජාකොබ්, 1 හා 2 පේදුරු, 1,2 හා 3 ජොහාන්, ජුද් යන ග්‍රන්ථ ක්‍රි.ව. 90 - 100 කාලය වන විට ලියා අවසන් වී තිබුණි. ක්‍රි.ව. 90 දී මධ්‍යධරණී මුහුද අසල ජම්මියා නුවර පැවැත්වූ රබ්බිවරුන්ගේ සම්මේලනයේදී ඔවුන් තීරණයක් ගෙන ඇත. එනම් කිතු දහම වැළඳගත් ජුදාවරුන් ජුදා සභාවෙන් බැහැර කිරීමය. ඒ අනුව ක්‍රිස්තු භක්තිකයෝ ජුදෙව්වන් විසින් ජුදා සිනගෝග වලින් පන්නා දමන ලදහ. ඒ හේතුවෙන් තව දුරටත් ජුදාවරුන් සමඟ රැඳී නොසිටි ක්‍රිස්තු භක්තිකයෝ ස්වාධීන සභාවක් ලෙස ගොඩනැගෙන්නට වූහ.

එසේම පාවුලු තුමාගේ ධර්මදූත සංචාර හේතුවෙන් ඒ කාලයේ සිට සුළු ආසියාව ඇතුළු අධිරාජ්‍යයේ නැගෙනහිර ප්‍රදේශවල කිතුනු සභා බිහිවිය. (උදා - අන්තියෝකිය, එපීසිය, ලවෝදීසිය ආදි නැගෙනහිර ප්‍රදේශයේ රටවල්) ක්‍රි.ව. 64 - 68 කාලයෙහිදී නීරෝ අධිරාජ්‍යයා බලයට පත් විය. ඒ අධිරාජයා විසින් පේදුරු හා පාවුලු යන දෙදෙනා ජෙරුසලමේ සිට රෝමයට කැඳවන ලද්දේ සිරකරුවන් ලෙසය. නඩු විභාගය අවසන් වී විනිශ්චය ලබා දෙනතෙක් ඔවුන් දෙපළ රෝමයේ සුබාරංචිය ප්‍රකාශ කර ඇත. ඒ අනුව ජෙරුසලමේ වූ ක්‍රිස්තු ශාසනයේ මූලස්ථානය රෝමය බවට පත් විය. පසුව ක්‍රි.ව. 64 දී පේදුරු තුමාද ක්‍රි.ව. 68 දී පාවුලු තුමා නීරෝ අධිරාජ්‍යයා විසින් ජීවිතක්ෂයට පත් කරන ලදහ.

පසු කාලයේ දී වෙස්පේසියන් අධිරාජයා ජෙරුසලමේ ඇතිවූ ජුදෙව් කැරැල්ල (ක්‍රි.ව. 66-70) මැඩපැවැත්වීමේදි පලස්තීනයේ විසූ ආගමික කණ්ඩායම් වන සෙලාට්වරු, එසේනිවරු, සද්දුසිවරු යන ජනවර්ග දරුණු ලෙස පීඩාවට පත්වී අහෝසි වූ බව සඳහන් වේ. ඒ ජුදා - රෝම යුද්ධය අවසානයත් සමඟ ටයිටස් සෙනවියා විසින් ජෙරුසලම් දේව මාලිගාව මුළුමනින්ම විනාශ කර දමන ලදී. භීතියට පත් ජුදා වරු ජෙරුසලම අතහැර විසිරී ගියහ.

එසේම ඒ යුගයේදී රදගුරුවරුන් විසින් ස්ථාපිත කරන ලද සභා ජනවන්දනාව (දේවවන්දනාව) හේතුකොට ගෙන පවත්වන ලද වත්පිළිවෙත්වල වෙනස්කම් දැකිය හැකිය. එනම් ඒ ඒ ප්‍රදේශ තුළ වූ සංස්කෘතිය, භාෂාව හේතුවෙන් වෙනස්වීම් ඇති විය. එලෙස ගොඩනැගුණ සභා 5 කි. ඒවා අග්‍රපිතෘක සභා ලෙස හැඳින්වේ.

ඒ අනුව1.රෝමය 2.කොන්ස්තන්තිනෝපලය 3.අන්තියෝකිය 4.ඇලෙක්සැන්ඩ්‍රියාව 5.ජෙරුසලම් සභා ලෙසය. ඒ සභා පාලනය කරන ලද්දේ බිෂොප්වරුන් විසිනි. බිෂොප්වරුන් ලෙස හැඳින්වූවද ඔවුන් ගිහියන් අතරින් තෝරාගත් සභාවේ සේවකයෝය. මුලාදෑනිවරුන් නොව වැඩිමහල්ලෝය.





### අධිරාජ්‍යයේ රාජ්‍ය පීඩනය

මුල් ක්‍රිස්තියානි සභාවේ තොරතුරු දැනගත හැකි වන්නේ අපෝ. ක්‍රියා පොත, පාවුලු තුමාගේ සංදේශ පොත්, අපෝස්තුලු වරුන් විසින් සම්පාදිත ඩිඩාකේ ග්‍රන්ථය සහ අපෝස්තලික සම්ප්‍රදාය යන කෘතිවලිනි. ඩිඩාකේ ග්‍රන්ථය ක්‍රි.ව. 1 වන සියවසේ අග භාගයේදී ලියන්නට ඇතැයි සැලකේ. ඒ ග්‍රන්ථයේ පරිච්ඡේද 16 කි. පසු කාලයේදී ඒ ග්‍රන්ථය අස්ථාන ගතවී ක්‍රි.ව. 1873 දී ග්‍රීක කතෝලික සභාවේ (ඕතොඩොක්ස් සභාව) දේවස්ථානයක තිබී හමු වී ඇත. මුල් අපෝස්තලික සභාව පූප කඩා ගැනීම සම්බන්ධව ඒ ග්‍රන්ථයෙන් විවරණය කර ඇත්තේ **"ඔබේ පූජාව නිර්මල පූජාවක් වන පිණිස පළමුව ඔබේ පාපොච්චාරණයෙන් පසුව එක්වී රොටි කඩා ස්තුති දෙන්න"** (ඩිඩා. 14). එලෙස රොටි කඩා ගැනීමෙන් එක්සේසත් වූ ක්‍රිස්තු ශාසනයට රෝම අධිරාජ්‍යයාගේ කුරිරු පීඩනවලට මුහුණ දීමට සිදුවිය.

රාජ්‍ය පීඩන යුගය ආරම්භ වන්නේ ක්‍රි. ව. 64 දීය. ඒ පරිච්ඡේදය නිමා වී ක්‍රිස්තු ශාසනය නිදහස ලබා ගන්නේ ක්‍රි.ව. 313 දීය. ඒ කාලය අතර තුර සභාවට පීඩා කළ අධිරාජ්‍යවරුන් 10 දෙනෙකි. ප්‍රාණපරිත්‍යාගිවරුන් බොහෝ ප්‍රමාණයකි. ඒ අනුව

#### 01. ක්‍රි. ව. 64 - 68 නීරෝ අධිරාජයා

මොහු රෝම නගරය ගිනිබත් කොට ඒ වරද ක්‍රිස්තු භක්තිකයන් වෙත පැවරීය. ඔහු කිතුනුවන්ව වන සතුන්ගේ ආහාරය පිණිස පණ පිටින් විසි කිරීම, කිතුනුවන්ගේ ශරීරවලට තෙල් තවරා රාත්‍රි කාලයේ ආලෝකය ලබා ගැනීමට කණුවලට තබා බැඳ ගිනි තැබීම, සිරගත කිරීම වැනි දරුණු පීඩා කළේය. ඒ යුගයේ ප්‍රාණ පරිත්‍යාගි වූවන් ලෙස ශු. පාවුලු, ශු. පේදුරු තුමන්ලා පෙන්වා දිය හැකිය.

#### 02. ක්‍රි. ව. 81 - 96 දොමීෂියන් අධිරාජයා

තමන්ව දේවත්වයෙන් පුදන ලෙස ඔහු නියෝග කළේය. එසේ නොකරන අය අදේවවාදීන් ලෙස සලකා පීඩා කරන ලදී. රටින් පිටුවහල් කිරීම, කුරුස පත් කිරිම වැනි දරුණු දඬුවම් ක්‍රම අනුගමනය කළේය. ඒ යුගයේ ප්‍රාණ පරිත්‍යාගි වූවන් ලෙස ශු. ප්ලේවියස්, ශු. ක්ලෙමෙන්ට්, ශු. අන්ද්‍රේ, ශු. තිමෝති තුමන්ලා පෙන්වා දිය හැකිය.

#### 03. ක්‍රි. ව. 98 - 117 ට්‍රාජන් අධිරාජයා

මොහුගේ අදහස වූයේ කිතුනුවන් පවත්වන ජනවන්දනා (දේවවන්දනාව) ක්‍රමය දූෂ්‍ය බවය. ඒ රජ වැරදි අවබෝධයකින් යුතුව කිතුනුවන්ට පීඩා කළේය. ඉන් මිදීම සඳහා කිතුනුවන් විසින් කැටකුම්ස් හෙවත් භූගත සුසාන භූමි තුළට ගොස් සැඟවී ජනවන්දනාව (දේවවන්දනාව) පවත්වා ඇත. ඒ රජතුමාගේ නියෝගයක් ලෙස රෝම දෙවි දේවතාවන්ට වන්දනා කිරිම කිතුනුවන්ට අනිවාර්ය විය. ඒ යුගයේ ප්‍රාණ පරිත්‍යාගීන් ලෙස අන්තියෝකියේ රදගුරු ශුද්ධවූ ඉග්නාසියස් තුමා, ශු. සිමියොන් තුමා පෙන්වා දිය හැකිය.

#### 04. ක්‍රි. ව. 161 - 180 මාකස් අවුරේලියස් අධිරාජයා

මොහුට කිතුනුවන්ගේ ප්‍රාණපරිත්‍යාගී භාවය නොරුස්සනසුලු විය. අධිරාජ්‍යයා ප්‍රකාශ කරන ලද්දේ ජල ගැලීම්, වසංගත, ස්වාභාවික විපත්, ම්ලේච්ඡ ආක්‍රමණ සියල්ලට හේතුව ක්‍රිස්තු භක්තිකයන් කෙරෙහි ඇති දේව කෝපය බවය. එහි ප්‍රතිඵලයක් ලෙස අධිරාජ්‍යය දේව ශාපයට ලක්වී ඇතැයි පැවසීය. එලෙස ප්‍රකාශ කර කිතුනුවන්ට දරුණු ලෙස පීඩා කළහ. ඒ අවස්ථාවේ තම ප්‍රාණය දෙවිඳුන් වෙත පුදන ලද්දේ ශු. ජස්ටින්, ශු. සිසිලියා, ශු. බෝටිනුස්, ශු. පිලර්දීන් ශු. පොලිකාප් තුමන්ලා වෙති.

#### 05. ක්‍රි. ව. 202 - 211 සෙප්ටිමස් සෙවරස් අධිරාජයා

මොහු ගේ නියෝගය වූයේ කිසිවකුට බව්තිස්මය දීම හෝ චර්ම ඡේදනය කිරීම හෝ තහනම් බවය. ඒ රජ සමූහ වශයෙන් කිතුනුවන් මරා දැමීමට පියවර ගති. ඒ යුගයේ ප්‍රාණපරිත්‍යාගීන් ලෙස ශු. අයිරේනියස් තුමා, ශු. පර්පචුවා තුමිය, ශු. ෆෙලිසිටා තුමිය පෙන්වා දිය හැකිය.

#### 06. ක්‍රි. ව. 235 - 238 මැක්සිමිනස් අධිරාජයා

ප්‍රථම වරට රදගුරුවරුන්ට හා පූජකවරුන්ට පීඩා කිරීම ආරම්භ කරන ලද්දේ ඒ අධිරාජයා විසිනි. මොහු රදගුරුවරුන් හා පූජකවරුන් සොය සොයා

රැගෙනවිත් පතල්වල කම්කරුවන් ලෙස බර වැඩ සඳහා යෙදවීය. ඉන් බලාපොරොත්තු වූයේ නැගී එන ශාසනයේ කටයුතු අඩපණ කිරීමය.

ශු. අන්තේරුස් (අන්ද්‍රයාස්), ශු. පොන්සියස් තුමන්ලා ප්‍රාණපරිත්‍යාගීන් ලෙස ඒ යුගයේ සැලකේ.

**07. ක්‍රි. ව. 249 - 251 ඩේසියස් අධිරාජයා**

අධිරාජ්‍යයාගේ පිළිමවලට පුද පූජා කිරීමට බල කරන ලදී. එලෙස වන්දනා කරන අයට ලිබේලුස් (Libellus) නමින් සහතිකයක් නිකුත් කර ඇත. ඒ සහතිකය ළඟ තබා නොගත් අයට දඬුවම් කෙරිණි. ඒ පීඩාවෙන් ගැලවීම සඳහා බොහෝ කිතුනුවෝ වනගත වී තාපස දිවියට පෙළඹුණහ. ඒ යුගයේ ප්‍රාණපරිත්‍යාගීන් ලෙස ශු. ෆේබියන්, ශු. අගතා, ශු. ඇලෙක්සැන්ඩර්, ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශු. ඩයෝසියස් , ශු. පපියාස් ඔරිජින් තුමන්ලා වූහ.

**08. ක්‍රි. ව. 254 - 260 වැලේරියන් අධිරාජයා**

මේ අධිරාජයා පණවන දරුණු නියෝග 2 කි. 1. පූජකවරුන් ප්‍රතිමාවලට පූජා පැවැත්විය යුතුය. 2. පූජක වරුන්ට හා කිතුනුවන්ට දැඩි ලෙස පීඩා කළ යුතුය. මොහු දෙව්මැදුරු ගිනිබත් කළේය. කිතුනු පොත පත ගිනි තබා විනාශ කළේය. ශු. ලොරන්ස් තුමා, ශු. දෙවන සික්ටස් පාප්තුමා ශු. සිප්‍රියන් තුමා ප්‍රාණ පරිත්‍යාගිවරුන් වෙති.

**09. ක්‍රි. ව. 274 - 280 අවුරේලියස් අධිරාජයා**

කිතුනුවන්ට පීඩා කළ යුත්තේ පොදු යහපත සඳහා බව ඒ අධිරාජයා ප්‍රකාශ කළේය. මොහුට අවශ්‍ය වූයේ ඒ තුළින් රෝම සෙනට් සභාවේ සාමාජිකයන්ගේ පක්ෂපාතභාවය ගැනීමේ අරමුණෙනි. ශු. ෆීලික්ස් තුමා, ශු. ඩෙනිස් තුමා, ප්‍රාණ පරිත්‍යාගීන් ලෙස සැලකිය හැකිය.

**10. ක්‍රි. ව. 284 - 305 දියොක්ලේසියානු අධිරාජයා**

මොහුට අවශ්‍ය වූයේ කිතු දහම අධිරාජ්‍යයෙන් මුළුමනින්ම උපුටා දැමීමටය. ක්‍රි. ව. 303 දී දරුණු නියෝග 4 ක් ප්‍රකාශයට පත්කර කිතුනුවන්ට දරා ගත නොහැකි ලෙස පීඩා කළේය. රෝමයේ පවත්වන අදේවවාදී වත්පිළිවෙත්වලට කිතුනුවන් සහභාගි විය යුතුම බවට බල කළේය. ශු. සෙබස්තියන් තුමා, ශු. තාර්ෂස් තුමා, ශු. කොස්ටාස් තුමා, ශු. ඩේමියන් තුමා, ශු. ඇග්නස් තුමිය, ශු. ලුසියා තුමිය විශ්වාසය වෙනුවෙන් දිවි දුන් පුද්ගලයෝය.

**පීඩනයේ යහපත හා අයහපත**

කිතුනුවෝ තම විශ්වාසය ශක්තිමත් කර නිර්භීතව සාක්ෂි දැරූහ. කෙතරම් දරුණු පීඩා මධ්‍යයයේ වුවද ප්‍රාණ පරිත්‍යාගීන්ගේ රුධිරය සභාව ගොඩනැගෙන බීජය බවට පත්වී ක්‍රිස්තු ශාසනය අඛණ්ඩව වර්ධනය විය. කිතුනුවන් අතර පරාර්ථකාමීත්වය, එකිනෙකාට පරිත්‍යාගශීලී වීම වර්ධනය විය.

දරුණු පීඩා හේතුවෙන් කිතුනුවන්ගේ ජීවිත, දේපළ විනාශ විය. ඔවුන්ට ප්‍රදේශ අතහැර පලා ගොස් සැඟවී සිටීමටත්, බියපත් වීමටත් සිදුවිය. ඔවුහු ඇතැම් විට රටින් පිටුවහල් කරනු ලැබූහ.

*ආශ්‍රිත ග්‍රන්ථ : සෝමරත්න මහාචාර්ය ජී. පී. වී. - ක්‍රිස්තු සාසනයේ ඉතිහාසය, පළමු කාණ්ඩය / ලෝව් නීටා, පෙරදිග ක්‍රිස්තියානියේ විවිධ සභා / 13 ශ්‍රේණිය ක්‍රිස්තියානි ධර්මය ගුරු මාර්ගෝපදේශය / 13 ශ්‍රේණිය ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය ගුරු මාර්ගෝපදේශය*

සටහන
**ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා**

**ආදරණීය දරුවනි**

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සන නිර්මාණ,
කවි, ගීත, නිසදැස්,
කෙටිකතා, ලිපි, සිතුවිලි
ආදී වශයෙන් ලබා ගැනීමට,
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමඟ
ඔබගේ භාරකරුගේ
දුරකතන අංකය සහ ලිපිනය ද
අප වෙත එවන්න.

සංස්කාරක පියතුමා,
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන,
කොළඹ 10.
Email: bhakthi.prabodhanaya@gmail.com

# ආදරයෙන් සිහිපත් කරමු...



පූජක පුතකු පුදසුන වෙත ඔසවන්න
ගරු පියතුමනි ඔබ දිවියට අත දුන්න
යැදුමෙන් පැවතුමෙන් නිතරම හිත දුන්න
අම්මේ ඔබත් සුරපුරයට පැමිණෙන්න

ජේසුනි අපේ මව දැන් සුරපුර ගාව
එහි දොර ඇරෙනු ඇත ඇය හට නොපමාව
යදිමින් දෙව් මවුන් පාමුල කරුණාව
ඔබ හට පතමි මොක් පුරයේ සිරියාව

- බෙනඩික් විජේසිංහ -

ඩබ්ලිව් බී. සෙලින් විනිප්‍රඩ් ප්‍රනාන්දු අප ආදරණීය මෑණියන් පසුගිය පෙබරවාරි 18 වන බ්‍රහස්පතින්දා මළහිරු බසින සන්ධ්‍යාවේ අපගෙන් සදහටම සමුගෙන සමිඳුන්ගේ නිවාසයේ සදාතන වාසය සඳහා ගියාය.

වචනයේ පරිසමාප්ත අරුතින්ම සැබෑ මවක වූ ඇය වැයවෙමින්, කැපවෙමින් සියල්ල දරාගෙන දෙවිඳුන් තුළ අචල විශ්වාසයක් තබමින් දේවමාතාවන්ට මහත් භක්තියකින් දුකසැප, රෝගී නීරෝග, වාසනාවන්ත අවාසනාවන්ත යන අවස්ථාවලදී සියලු අභියෝගවලට මුහුණ දෙමින් අප පවුලේ පියා ඇතුළු දූ දරුවන් සියලු දෙනා සමග ජීවිතය බෙදාගනිමින් ගෙවූ දිවිය චමත්කාරය, සෙනෙහෙබරය, පලබරය. නිරන්තරයෙන් යාච්ඤාවට නැඹුරු වූ ඇය වචනවලින් විස්තර කළ නොහැකි මතක සටහන් ගණනාවක් අප හද සන්තානයේ අමරණීය කර හමාරය. මැයි මාසයේ 18 වන දාට ඇය සමුගෙන තෙමසක් ගෙවී යන විට සමිඳු නිවහනේ සදා සාමය අපි හදවතින්ම අපගේ මෑණියන්ට ප්‍රාර්ථනා කරමින් දිනපතා යාච්ඤා කරමු. දිව්‍ය පූජාව ඔප්පු කරමු. ඇයට දුන් ජීවිත තිළිණයට දෙව් පියාණන් වහන්සේට තුති පුදමු.

එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

# ආශිර්වාදලත් රෝමානු කතෝලික විවාහයක්

## සඳහා විවාහ අපේක්ෂකයකු/අපේක්ෂිකාවක් සොයනා

## රෝමානු කතෝලික ඔබ සඳහාම පමණක් වෙන්වූ

**විශ්වාසනීය, ක්ෂණික, තොරතුරු හා පෞද්ගලිකත්වයට උපරීම ආරක්ෂාවක් සහිත අසමසම ඩිජිටල් මොබයිල් ඇප් සේවාව**

# www.kithunu.com



**මෙම විවාහ අපේක්ෂක සේවාව ලබා ගත හැක්කේ මීසම් භාර පියතුමකු හරහා තහවුරු කරගත් රෝමානු කතෝලික අය හට පමණි.**

සම්පූර්ණ කරන ලද සියලු ගිණුම් සඳහා දින 7ක ට්‍රයල් පැකේජ සේවාව නොමිලයේ හිමිවේ.

ඉන්පසු, කාලසීමාව (මාස 2, මාස 6 හෝ අවුරුදු 1) / සම්බන්ධතා ගණන මත පදනම් වූ පැකේජයක් සුලු ගාස්තුවක් ගෙවා මිලදී ගෙන සේවාව ඉදිරියටම පවත්වාගෙන යා හැක. සාර්ථකවූ විවාහ යෝජනා සඳහා හෝ අනෙකුත් කරුණු සඳහා හෝ <u>සැඟවුනු අමතර ගාස්තු කිසිවක් නොමැත</u>.

කතෝලික පූජකතුමන්ලාගේ/පැවිදි සහෝදර සොහොයුරියන්, සහෝදරතුමන්ලා සහ දෙවිකන්‍යාවන්/කන්‍යාරාම වල පැවිදි දිවිය සඳහා සූදානම් වන්නාවූ අයගේ විවාහ අපේක්ෂක සහෝදරා/සහෝදරියන් හට මෙම සේවාව සම්පූර්ණයෙන්ම නොමිලයේ ලබා ගත හැක*.

PC / Laptop Version https://app.kithunu.com

GET IT ON Google play

# 0117-483-899

WhatsApp Only: +94 773-483-899

*වැඩි විස්තර සහ කොන්දේසි සඳහා අප අමතන්න.

# Kithunu

Putting Faith Back Into Marriage

KithunuSriLanka

**www.kithunu.com**



මිල රු.35/=
(සහන මිල)

"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා විසින් කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදි. පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. QD/81/පුවත්/2021